2022

ANNUAL PERFORMANCE REPORT

වාර්ෂික කාර්යසාධන වාර්තාව
வருடாந்த செயற்திறன் அறிக்கை



අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
ஏற்றுமதி விவசாயத் திணைக்களம்
DEPARTMENT OF EXPORT AGRICULTURE

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சு
Ministry of Plantation Industries

2022

වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயற்திறன் அறிக்கை

ANNUAL PERFORMANCE REPORT

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

ஏற்றுமதி விவசாயத் திணைக்களம்

DEPARTMENT OF EXPORT AGRICULTURE

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சு

Ministry of Plantation Industries

පටුන	පිටුව
01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරංශය	05
1.1. හැඳින්වීම	05-06
1.2.ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු	07
1.3.ප්‍රධාන කාර්යයන්	08
1.4.සංවිධාන සටහන	09
1.5.දෙපාර්තමේන්තුවේප්‍රධාන අංශ හා ආයතන	10
1.5.1. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ	
1.5.2. දිස්ත්‍රික් කාර්යාල	10
02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම	11
2.1. විශේෂ ජයග්‍රහණ හා අත්පත් කර ගැනීම්	11-22
2.2. අභියෝග හා ඉදිරි ඉලක්ක	23
2.2.1. අභියෝග	23-24
2.2.2. අනාගත ඉලක්ක / අරමුණු	24-26
03. පරිච්ඡේදය - මූල්‍ය කාර්ය සාධනය	27
3.1.මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය	27
3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	28
3.3.මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	29
3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්	30
3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	30
3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය	30
3.7.මු.රෙ.208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙක් ලෙස මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන	31
3.8.මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	31
3.9.විගණකාධිපති වාර්තාව	32-38
04. පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක	39
4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)	39
4.1.1.අපනයන කෘෂි බෝග සංවර්ධන වැඩසටහන	39-44
4.1.2. ගොඩනැඟිලි ඉදිකිරීම්,අළුත්වැඩියා, ඉඩම් සංවර්ධනය හා යටිතල පහසුකම්	44

05.පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේකාර්ය සාධනය 45
5.1. දෙපාර්තමේන්තුවට අදාළව හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු 45-46
5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 47-50

06.පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ 51
6.1.සේවක සංඛ්‍යා කළමණාකරණය 51
6.2.ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපා ඇති ආකාරය 51
6.3.මානව සම්පත් සංවර්ධනය 51-52

07.පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව 53-58
ඇමුණුම 01 - අපනයන කෘෂි බෝගයන්හි ආනයන හා අපනයන පරිමාව 59

පරිච්ඡේදය 01

ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

ශ්‍රී ලංකාව පුරාතන සමයේ සිට කුරුඳු සඳහා කීර්ති නාමයක් දිනා සිටිය ද ජාතික මට්ටමෙන් මෙම කර්මාන්තය සඳහා අවධානය යොමු කෙරුණේ 1971 ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්තිය මඟින්ය. ඉන් පසුව 1972 දී අමාත්‍ය මණ්ඩල සන්දේශයක් තුළින් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට අනුබද්ධිතව සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදි. 1975 වර්ෂයේ දී මෙම දෙපාර්තමේන්තුව කෘෂිකර්ම අමාත්‍යාංශය යටතට ගෙන එන ලදි. ලෝක ආහාර වැඩසටහන (WFP)සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) මඟින් මූලාරම්භ කරන ලද බෝග විවිධාංගීකරණ සංවර්ධන වැඩසටහනේ කාර්යයන්වල කොටසක් දෙපාර්තමේන්තුවට පැවරීමත් සමඟ දෙපාර්තමේන්තුවේ එවකට කාර්යභාර්ය බවට පත්ව තිබූ මායිම් ඉඩම්වල කුළුබඩු වගා කිරීම වෙනුවට අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව කුළුබඩු ආශ්‍රිත බෝග සංවර්ධනය මත පදනම් වූ අපනයන සංවර්ධනයේ නියමුවා විය.

1992 අංක 46 දරණ පාර්ලිමේන්තු පනතින් මෙම දෙපාර්තමේන්තුව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යනුවෙන් නැවත නම් කරන ලදි. එමඟින් කුළුබඩු සහ වෙනත් කෘෂිකාර්මික බෝග අපනයනයට අදාළව නෛතික අධිකාරි බලය දෙපාර්තමේන්තුව වෙත පවරන ලදි. එතැන් සිට මෙම දෙපාර්තමේන්තුව ක්ෂේත්‍ර, පර්යේෂණ මෙන්ම සංවර්ධන ක්‍රියාකාරකම් මෙහෙය වීම් කටයුතු සිදු කරන ලදි. ඒ අනුව කුළුබඩු ක්ෂේත්‍රයේ ප්‍රවීණයා වෙමින් එහි සංවර්ධනය සහ ව්‍යාප්තිය පිළිබඳ දීප ව්‍යාප්ත ජාලයක් මඟින් දෙපාර්තමේන්තුව මෙම අංශයේ අදාල පාර්ශවකරුවන්ට පහසුකම් සපයයි.

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් ඉලක්ක කරන්නේ කුරුඳු, ගම්මිරිස්,කරාඹු, සාදික්කා,කරඳමුංගු,කෝපි, කොකෝවා, බුලත්, පුවක් ,වැනිලා, පැහිරි, සේර, ගොරකා, ඉඟුරු හා කහ ආදී කුළුබඩු බෝග පානීය භෝග සහ උත්තේජක භෝග අපනයනය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමයි. මෙහි දී දෙපාර්තමේන්තුවේ වගකීම වනුයේ අපනයන කෘෂි බෝග වගා වපසරිය වැඩි කිරීම, පවත්නා වගාවල ඵලදායීතා කටයුතු, පසු අස්වනු තාක්ෂණ ප්‍රවර්ධන වැනි සංවර්ධන කටයුතු හා නව ප්‍රභේද හඳුන්වා දීම, නව තාක්ෂණික දැනුම සහ නවෝත්පාදන අපනයන කෘෂි බෝග ක්ෂේත්‍රයට හඳුන්වා දීමයි.

ඒ අනුව 2022 වසරේ දෙපාර්තමේන්තුව සඳහා සෘජුව අයවැය මඟින් වෙන් වූ රුපියල් මිලියන 250.00ක ප්‍රතිපාදන හා අමාත්‍යාංශයට වෙන් වූ ප්‍රතිපාදන වලින් ලබා දුන් රුපියල් මිලියන 610.95 ක් වශයෙන් සමස්ථය රුපියල් මිලියන 860.95 මඟින් දෙපාර්තමේන්තු සමස්ථ ප්‍රාග්ධන ආයෝජන

වැඩසටහන් ක්‍රියාවට නංවන ලද අතර රුපියල් මිලියන 16.5 ක ප්‍රාග්ධන ආයෝජනයෙන් පර්යේෂණ අංශයේ කටයුතු සිදු කරන ලදි.

නිෂ්පාදන පරිමාව ඉහළ දමමින් අපනයන ආදායම ඉහළ නැංවීමේ දෙපාර්තමේන්තු ප්‍රධාන ඉලක්කය සපුරා ගැනීමේ දී වගා වපසරිය වාර්ෂිකව ඉහළ නැංවීම සඳහා යොමු කළ අවධානයට හා සාපේක්ෂව අපනයන භෝග වල අගය එකතු කිරීමේ නිෂ්පාදන ඉහළ නැංවීම තුළින් ඉහළ වෙළඳපල වාසි ලබා ගැනීම පිළිබඳවද විශේෂ අවධානයක් 2022 වසර තුල දී යොමු කරන ලදි.

පාලනය කළ නොහැකි බාහිර බලපෑමක් වන Covid -19 ගෝලීය වසංගත තත්ත්වයේ අහිතකර බලපෑම , දේශගුණික කාලගුණික වෙනස්කම් හා වෙළඳපල මිලෙහි බලපෑම හා 2022 වර්ෂයේදී ඇති වුණු බලශක්ති අර්බුදය මාධ්‍යයේ වුව ද 2021 රුපියල් මිලියන 102,939.40 ක් ක් වූ අපනයන ආදායම 2022 වන විට රුපියල් මිලියන 149,050.41ක් දක්වා ඉහළ නංවා ගැනීමට හැකිවීම , අර්බුදයක් බවට පත් වූ කහ නිෂ්පාදනය සාධනීය මට්ටමට ළඟා කර ගැනීමට හැකිවීමත් සාධනීය ලක්ෂණයක් විය.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

කුළුබඩු හා ආශ්‍රිත නිෂ්පාදනයෙන් විශිෂ්ටත්වය

මෙහෙවර

වැඩි විදේශ විනිමයක් ඉපයීමත් අපනයන කෘෂිබෝග ක්ෂේත්‍රයේ නිරත සියළු පාර්ශවකරුවන්ගේ තිරසාර ආර්ථික හා සමාජයීය සංවර්ධනයත් පෙරදැරි කර ගනිමින් , පරිසරය සුරැකෙන අයුරින් අපනයන කෘෂිබෝග නිෂ්පාදනවල ප්‍රමාණාත්මක හා ගුණාත්මක ප්‍රවර්ධනයක් ඇති කිරීමට අවශ්‍යවන්නාවූ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාවලිය සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

අරමුණු

අපනයන පරිමාව වැඩිකිරීම හා නිෂ්පාදිතයේ ගුණාත්මකභාවය උසස් කිරීම තුළින් ඉහළ විදේශ විනිමය ඉපයීමක් සඳහා අපනයන කෘෂිබෝග අංශය සංවර්ධනය කිරීම.

1.3. ප්‍රධාන කාර්යයන්

- අපනයන කෘෂි බෝග වගාව හා පිරිසැකසුම්කරණය සංවිධානය හා ප්‍රවර්ධනය.
- බෝග සංවර්ධනය, බෝග වගාව, බෝග ආරක්ෂණය, පසු අස්වනු කළමනාකරණය හා සමාජ ආර්ථික විද්‍යාව සම්බන්ධ බහු විෂයානුබද්ධ පර්යේෂණ සිදු කිරීම.
- ඉහළ ගුණාත්මකභාවයකින්යුත් රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා බෙදාහැරීම.
- බෝග නිෂ්පාදනය, ඵලදායිතා වර්ධනය හා ගුණාත්මකභාවය වර්ධනයට අදාළ අපනයන කෘෂි බෝග ආධාර යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.
- බෝග ආරක්ෂණ උපදේශන සේවා සැපයීම.
- ඒකාබද්ධ පළිබෝධ කළමණාකරණය ප්‍රවර්ධනය.
- ඒකාබද්ධ ශාක පෝෂණ කළමණාකරණය ප්‍රවර්ධනය.
- කාබනික වගාව ප්‍රවර්ධනය.
- අලෙවිකරණය, ගුණාත්මක ප්‍රමිතීන් හා මිල ගණන් ආදිය පිළිබඳ දත්ත නිකුත් කිරීම.
- අපනයන කෘෂි බෝග නිපැයුම් හා රෝපණ ද්‍රව්‍ය ආනයනය පාලනය කිරීම.
- අපනයන කෘෂි බෝග නිෂ්පාදනය, පිරිසැකසුම්කරණය, අලෙවියෙහි නියුතු පුද්ගලයින් හා අනෙකුත් පාර්ශවකරුවන් පුහුණු කිරීම.
- වැවිලි අංශය තුළ අපනයන කෘෂි බෝග ප්‍රවර්ධනය සඳහා උපදේශන සේවා සැපයීම.
- අපනයන කෘෂි බෝග ආශ්‍රිත රාජ්‍ය හා පෞද්ගලික ආයතන අතර සම්බන්ධතාව ශක්තිමත් කිරීම.
- 1992 අංක 46 දරණ අපනයන කෘෂිකර්ම පනත යටතේ විධායක අධිකාරී බලය පැවරීම.
- අපනයන කෘෂි බෝග ආශ්‍රිත ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධයෙන් අනෙකුත් රාජ්‍ය සංවිධාන වෙත උපදෙස් සැපයීම.
- තාක්ෂණික ආදර්ශණ පවත්වාගෙන යාම.



නි.අ. - නියෝජ්‍ය අධ්‍යක්ෂ, **ස.අ.** - සහකාර අධ්‍යක්ෂ,**ව්‍යා.උ.ඒ.** -ව්‍යාපාර උපදේශන ඒකකය, **ම.ප.ම.**-මධ්‍යම පර්යේෂණ මධ්‍යස්ථානය, **පැ.සං** - පැලෑටි සංරක්ෂණය, **උ.ප.ම.** -උප පර්යේෂණ මධ්‍යස්ථානය,**ආ.ප.ඒ.**- ආර්ථික පර්යේෂණ ඒකකය,**සං.ලේ.** -සංඛ්‍යාලේඛනඥ, **ප්‍ර.අ.විගණක** - ප්‍රධාන අභ්‍යන්තර විගණක, **පරි.නි.** - පරිපාලන නිලධාරී, **පරි.නි.(මෙ.)** - පරිපාලන නිලධාරී(මෙහෙයුම්), **භාෂා පරි.**- භාෂා පරිවර්තක, **පර්.සං.ස**- පර්යේෂණ හා සංවර්ධන සහකාර, **සං.ස.**- සංවර්ධන සහකාර, **අය.සහ.**- අයවැය සහකාර, **සං.නි.** - සංවර්ධන නිලධාරී, **ප්‍ර.නා.නි** - ප්‍රධාන නාක්ෂණ නිලධාරී කොා.හා සං.නා.නි - තොරතුරු හා සංනිවේදන තාක්ෂණ නිලධාරී, **කළ.ස.**- කළමනාකරණ සහකාර, **පුස්ත.**- පුස්තකාලාධිපති, **දි.ව්‍යා.නි.** - දිස්ත්‍රික් ව්‍යාප්ති නිලධාරී, **ව්‍යා.නි.**- ව්‍යාප්ති නිලධාරී, **කා.නි.**- තාක්ෂණ නිලධාරී, **කා.නි-** කාර්මික නිලධාරී, **සං.කා.සහ.** - සන්නිවේදන තාක්ෂණ සහකාර,**ගොා.ක.** - ගොවිපළ කළමනාකරු,**ගොා.සේ.ස.**- ගොවිපළ සේවා සහකාර, **නි.පා.** - නිවාස පාලක.

1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා ආයතන

1.5.1. දෙපාර්තමේන්තුවේ ප්‍රධානඅංශ

1. සංවර්ධන අංශය
2. පර්යේෂණ අංශය
3. පාලන අංශය
4. ගිණුම් අංශය

1.5.2. දිස්ත්‍රික් කාර්යාල 17 ක් පහත අයුරින් ව්‍යාප්තව ඇත.

මධ්‍යම පළාත	- මහනුවර, මාතලේ, නුවරඑළිය
සබරගමුව පළාත	- කෑගල්ල, රත්නපුර
ඌව පළාත	- බදුල්ල, මොණරාගල
දකුණු පළාත	- ගාල්ල, මාතර, හම්බන්තොට
බස්නාහිර පළාත	- කොළඹ, කළුතර, ගම්පහ
වයඹ පළාත	- කුරුණෑගල(පුත්තලම දිස්ත්‍රික්කය ද ආවරණය වේ.)
නැගෙනහිර පළාත	- අම්පාර(මඩකලපුව දිස්ත්‍රික්කය ද ඇතුළත් වේ.)
උතුරු මැද පළාත	- අනුරාධපුර, පොළොන්නරුව

පර්යේෂණ මධ්‍යස්ථාන හා උප පර්යේෂණ මධ්‍යස්ථාන වල පිහිටීම

1. මධ්‍යම පර්යේෂණ මධ්‍යස්ථානය, මාතලේ
2. කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය, පළොල්පිටිය, කිහගොඩ, මාතර
3. අතුරුවගා හා බුලත් පර්යේෂණ මධ්‍යස්ථානය, දම්පැලැස්ස, නාරම්මල
4. ආර්ථික සහ අලෙවිකරණ පර්යේෂණ ඒකකය, ප්‍රධාන කාර්යාලය, පේරාදෙණිය
5. මැදරට පර්යේෂණ මධ්‍යස්ථානය, දැල්පිටිය ,ගම්පොල
6. පටක රෝපණ පර්යේෂණ මධ්‍යස්ථානය හා පැළ තවාන, වල්පිට ,ගම්පහ
7. උප පර්යේෂණ මධ්‍යස්ථානය, කුණ්ඩසාලේ
8. උප පර්යේෂණ මධ්‍යස්ථානය, නිල්ලඹ , ගලහ

දෙපාර්තමේන්තු මධ්‍යමපැළ තවාන්වල පිහිටීම

කුරුණෑගල දිස්ත්‍රික්කය	-	සෙරපීස් පැළ තවාන - පොල්ගහවෙල
		හොලොන්ගොල්ල පැළ තවාන - දොඩන්ගස්ලන්ද
		වෙන්නෝරුව පැළ තවාන - නාරම්මල
නුවරඑළිය දිස්ත්‍රික්කය	-	බ්ලැක්වෝටර් පැළ තවාන - ගිනිගත්හේන
		මුල්හාල්කැලේ පැළ තවාන - වලපනේ
මාතලේ දිස්ත්‍රික්කය	-	මධ්‍යම පැළ තවාන - ඇල්වල, උකුවෙල
මාතර දිස්ත්‍රික්කය	-	මධ්‍යම පැළ තවාන - මාපළාන, කඹුරුපිටිය
කෑගල්ල දිස්ත්‍රික්කය	-	මධ්‍යම පැළ තවාන - ගස්නාව, නෙලුන්දෙනිය
ගම්පහ දිස්ත්‍රික්කය	-	මධ්‍යම පැළ තවාන - වල්පිට
හම්බන්තොට දිස්ත්‍රික්කය	-	මධ්‍යම පැළ තවාන හා කුළුබඩු උද්‍යානය - මිද්දෙණිය

පරිච්ඡේදය 02

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 විශේෂ ජයග්‍රහණ හා අත්පත්කරගැනීම්

- 2022 වසර ආරම්භයේ සිට පැවැති බලශක්ති හා ආර්ථික අර්බුදයන් හමුවේ වුවද අපනයන කෘෂිකර්ම ක්ෂේත්‍රය හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීම මඟින් දේශීය ආර්ථිකය නංවාලීම හා ඒ තුලින් වැඩි විදේශ විනිමයක් උපයා ගැනීමේ අරමුණින් යුතුව 2022 වසරේදී , අපනයන කෘෂි බෝග සංවර්ධන වැඩසටහන යටතේ මහා භාණ්ඩාගාරය මඟින් ලබා දුන්. රු.මි.250.00 ක ප්‍රතිපාදන වලින් රු.මි. 240.85 ක් සංවර්ධන වැඩසටහන් සඳහා වැය වූ අතර, වැවිලි අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ අපනයන කෘෂි කළාප හා ආර්ථික ගෙවතු වගා වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

- අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වූ අපනයන කෘෂි කලාප වැඩසටහන යටතේ ලබා දුන් මුළු ප්‍රතිපාදන රු. මි. 400 ක ප්‍රමාණයෙන් රු . මි. 187 ක ගෙවීම් සිදු කර අවසන් කර ඇත. අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරනු ලැබූ ගෙවතු වගා වැඩසටහන සඳහා රු.මි. 225 ක් වෙන් කරන ලද අතර ඉන් රු මි. 112.2 ක වටිනාකමකින් යුතු ගෙවතු වගා සංවර්ධන වැඩසටහන් 2022 වසරේදී දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාවට නංවන ලදි. වැවිලි අමාත්‍යාංශය මඟින් 2022.09.26 වන දින සිට පැළයක් සඳහා වැයවන වටිනාකමින් කොටසක් අදාල ප්‍රතිලාභීන් විසින් දැරිය යුතු බවට ලබා දුන් උපදෙස් අනුව 2022.09.26 වන දින සිට 2022.12.31 දින දක්වා නිකුත් කරන ලද පැළ වෙනුවෙන් අදාල මුදල් ප්‍රතිලාභීන් විසින් ගෙවීමෙන් අනතුරුව පැළ ලබා දෙන ලදී.

  එම වැඩසටහන් වල ප්‍රතිඵල පිළිබඳ සැලකීමේ දී

- 2022 නව වගා වැඩසටහන යටතේ අපනයන කෘෂිබෝගයන් වන කුරුඳු , ගම්මිරිස් , සාදික්කා , කරාඹු, කොකෝවා, කරඳමුංගු, වැනිලා සහ කෝපි යන වගාවන්ගෙන් හෙක්ටයාර 272.11 ක් මෙම වැඩසටහන යටතේ සිදු කරන ලද අතර දෙපාර්තමේන්තුව මඟින් 2022 වර්ෂය සඳහා සැලසුම් කරන ලද භූමි ප්‍රමාණයෙන් 74% ක ඉලක්ක ගත ප්‍රමාණයක් අත්පත් කර ගැනීමට හැකි විය. ගොවීන් අතර අපනයන කෘෂි බෝග වගා කිරීම සඳහා ඉහළ ඉල්ලුමක් පැවති හෙයින් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් විවිධ වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදී. මෙහිදී දෙපාර්තමේන්තුව මඟින් සහතික කරන ලද අපනයන කෘෂි බෝග රෝපණ ද්‍රව්‍ය ගොවීන් වෙත ලබා දෙන ලදි. මේ යටතේ ගොවීන් සඳහා ලබා දෙන ලද අපනයන කෘෂි බෝග පැළ සංඛ්‍යාව පැළ 1,147,925 කි.

- දේශීය වශයෙන් අපනයන කෘෂි බෝග නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා කුරුඳු , ගම්මිරිස් බෝගයන් ප්‍රධාන කර ගනිමින් ගෘහස්ථ අවශ්‍යතාවය තම ගෙවත්ත තුලින්ම සපුරා ගැනීම අරමුණු කර ගනිමින් මුළු දිවයිනම ආවරණය වන පරිදි දිස්ත්‍රික් මට්ටමින් ආර්ථික ඵලදායීතාවයෙන් යුතු අපනයන කෘෂි බෝග ආදර්ශ ගෙවතු ස්ථාපිත කිරීමත් අතිරික්ත නිෂ්පාදන අලෙවි කිරීමත් මඟින් ගෘහස්ථ ආර්ථිකය ශක්තිමත් කිරීම හා අපනයන ආදායම ඉහළ නැංවීමේ පරමාර්ථයෙන් යුතුව ආර්ථික ශක්‍යතාවයෙන් යුත් අපනයන කෘෂි බෝග ආදර්ශ ගෙවතු ස්ථාපනය කිරීමේ හා අපනයන බෝග ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන 2022 වසර තුලදී ක්‍රියාවට නංවන ලදී.
- කුඩා ගෙවත්තකින් උපරිම ආර්ථික ප්‍රතිලාභ ලැබෙන මට්ටමට පත් කිරීම අරමුණු කර ගත් කුඩා ගෙවතු වැඩසටහන හා සෞභාග්‍යා ගෙවතු වැඩසටහන සඳහා පැළ ලබා දුන් අතර කුඩා ගෙවතු වැඩසටහන යටතේ 84,901 ක් ද සෞභාග්‍යා ගෙවතු වගා වැඩසටහන යටතේ පැළ 27,820 ක් ලබා දෙන ලදී.
- පොකුරු ගම්මාන වැඩසටහන යටතේ එක් ගම්මානයක් හෝ ගම්මාන කිහිපයක් ඒකාබද්ධ කොට පොකුරු ගම්මානයක් ලෙස එක් පොකුරු ගම්මානයකට අවම වශයෙන් සාමාජිකයින් 25ක්වත් සිටින සේ පොකුරු ගම්මාන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙහිදී, කණ්ඩායමක් ලෙස සංවිධානය කර පැළ නිකුත් කිරීමේ සිට අස්වනු අලෙවි කරන අවස්ථාව දක්වා ක්‍රමවත් සැලැස්මක් සකස්කර ගොවීන් සවිබල ගැන්වීමට සහ වෙළඳපල සම්බන්ධීකරණයට කටයුතු කරනු ලැබීය. මේ යටතේ වැනිලා, කරඳමුංගු හා සාදික්කා පැළ 41,456ක් පැළ ලබා දෙන ලදී.
- දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ ද කහ සහ ඉඟුරු වගා වැඩසටහන ක්‍රියාත්මක කළ අතර. හෙක්ටයාර 20.7 ක වපසරියක කහ සහ ඉඟුරු වගා කර ඇත.
- 2022 වසර තුලදී ද පුවක් වගා වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර, මෙමඟින් පරිසර සංරක්ෂණය අරමුණු කරන ලදී. පුවක් වගා ප්‍රවර්ධන වැඩසටහන යටතේ පුවක් පැළ 183,859 ක ප්‍රමාණයක් ගෙවතු , රාජ්‍ය , පුද්ගලික ආයතන හා වතු සමාගම් වෙත බෙදා දෙන ලදී.
- 2022 වසර තුලදී ද අපනයන කෘෂි බෝග ඵලදායීතා ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ අපනයන කෘෂි බෝග නිෂ්පාදනයන් ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් ප්‍රධාන අංශ තුනක් යටතේ මෙම වැඩසටහන ක්‍රියාවට නංවන ලදී. යහපත් ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම අනුගමනය කිරීම තුලින් පවත්නා වගාවන්හි ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා පාළු පැළ නොමිලයේ ලබා දීම , අපනයන කෘෂි බෝග කාලගුණ විපර්යාසවලට අනුහුරු කිරීම සඳහා සුදුසු ජල සම්පාදන ක්‍රම හඳුන්වාදීම තුලින් පවතින අපනයන කෘෂි බෝග වගාවන් ජල හිඟ තත්ත්වයන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය ක්ෂුද්‍ර ජල සම්පාදන ඒකක ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය ආයෝජන ආධාර ලබා දීම හා අපනයන බෝග වලට හානි කරන පලිබෝධ හා සත්ව හානි වළක්වා ගැනීමේ අරමුණින්

උපාංග හා පද්ධති හඳුන්වා දෙන ලදි. ඒ අනුව හෙක්ටයාර 828.85 ක් සඳහා පාළු පැළ ලබා දෙන ලද අතර බිංදු හා විසිරි ජල සම්පාදන පද්ධති 02 ක්, ආරක්ෂිත වැටවල් හා වගා ආරක්ෂිත පද්ධති 12 ක් ස්ථාපනය සඳහා පිරිවැයෙන් 50% අයෝජන ආධාර ක්‍රමය යටතේ කටයුතු සිදු කරන ලදි.

- ආර්ථික අභියෝග හමුවේ වුවද , පසු අස්වනු තාක්ෂණ වැඩසටහන 2022 වසරේදී ද ක්‍රියාවට නංවන ලදී. අපනයන කෘෂිබෝග නිෂ්පාදන වල පසු අස්වනු තාක්ෂණ ක්‍රියාවලිය විධිමත් කිරීම තුලින් නිෂ්පාදන ගුණාත්මය ඉහල නැංවීම, අගය වැඩිකල නිෂ්පාදන සඳහා දිරිමත් කිරීම සහ රාජ්‍ය ආයෝජන ආධාර ලබා දීමේ ක්‍රියාවලිය විධිමත් කිරීමේ අපේක්ෂාවෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.මෙම ආයෝජන ආධාර ක්‍රමය හුදෙක් අස්වනු සැකසීමේ නවීන තාක්ෂණික උපකරණ / යන්ත්‍රසූත්‍ර / ගොඩනැඟිලි / පහසුකම් හඳුන්වා දීම හා සැපයීමේ ක්‍රියාවලියක් පමණක්ම නොව අපනයන බෝග වගාවන්ගේ ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රියාමාර්ග ඉටු කිරීමට, දේශීය හා විදේශීය ප්‍රමිතීන්ට අනුව යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) අනුගමනය කරමින් අපනයන කෘෂිබෝග නිෂ්පාදනයන් හි ගුණාත්මය වැඩිදියුණු කිරීම, අගය එකතු කල නිෂ්පාදන දිරිගැන්වීම (Value Addition), රැකියා උත්පාදනය ඉහල නැංවීම උදෙසා වන සමස්ථ ක්‍රියාවලියක් සඳහා යොමු වූවකි.

- දෙපාර්තමේන්තුව මඟින් පසු අස්වනු තාක්ෂණ ආයෝජන ආධාර ක්‍රමය යටතේ කුඩා හා මධ්‍ය පරිමාණ කුරුඳු පිරිසැකසුම් මධ්‍යස්ථාන 42 ක් , අනෙකුත් පිරිසැකසුම් මධ්‍යස්ථාන 03 සහ කේන්ද්‍රීය පිරිසැකසුම් මධ්‍යස්ථාන 04 ක් සඳහා ආයෝජන ආධාර ලබාදෙන ලදි. පසු අස්වනු තාක්ෂණය යාන්ත්‍රිකරණය තුළින් අස්වනු වල ඉහළ ගුණාත්මකභාවයක් ලබාගැනීම හා මිනිස් ශ්‍රමය අවම ලෙස භාවිතය තුළින් නිෂ්පාදන වියදම අඩුකිරීම සඳහා යන්ත්‍රෝපකරණ 97 ක් හා කුරුඳු තෙල් නිස්සාරණ ඒකක 13 ක් සඳහා ආධාර ලබාදෙන ලදි.
- පතින්ගොල්ල කාබනික ගම්මානය සඳහා ජාත්‍යන්තරව පිලිගත් යුරෝපානු කාබනික සහතිකය ලබාදීමට කටයුතු කරන ලදී. ජාත්‍යන්තර කාබනික සහතිකය මේ වන විටත් ලබා ගෙන ඇති මහනුවර මන්දන්ඩාවල කාබනික ගම්මානයේ තෙවන වසර සහතිකකරණය සඳහා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන එම ගොවි සංවිධානයට ලබාදෙන ලදී.
- අපනයන කෘෂි බෝග සඳහා වූ යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) ලබාගැනීමට ඉදිරිපත් කර තිබූ අයදුම්පත් 494 ලියාපදිංචියෙන් පසු විගණනය සඳහා යොමු කරන ලදී. වසර තුල GAP සහතික ලබාගත් සංඛ්‍යාව 47 කි.
- අපනයන කෘෂි බෝග නිෂ්පාදනවල ගුණාත්මය සහතික කිරීම පිණිස ආරම්භ කරන ලද තත්ත්ව සහතික ලබාදීමේ වැඩසටහන යටතේ ISO 22000/HACCP සහතිකය එක් සැකසුම් මධ්‍යස්ථානයකටත් ,GMP සහතිකය එක් සැකසුම් මධ්‍යස්ථානයකටත් ලබාදෙන ලදී . තාක්ෂණික හා මූල්‍ය දායකත්වය අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ලබා දෙන ලදී.

- කුළුබඩු ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන් වෙනුවෙන් දුරකථනයෙන් උපදේශන සේවා 331 ක් හා සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් උපදෙස් දීම් 66 ක් පවත්වන ලදී.
- යූ ටියුබ් (youtube) තාක්ෂණය ඔස්සේ අපනයන ක්‍රියා පටිපාටිය සහ ගෝලීය වෙළඳපල ජයගැනීම ඉලක්ක කරගත් වැඩසටහන් 11 ක් විකාශනය කරන ලදී.
- අපනයන කෘෂිකර්ම ක්ෂේත්‍රයේ පාර්ශ්වකරුවන්ගේ ගැටළු සාකච්ඡා කිරීමට ගැනුම්කරුවන් හා නිෂ්පාදකයින් සම්බන්ධ කිරීමට තාක්ෂණික උපදෙස් ලබා ගැනීම සඳහා Whatsapp තාක්ෂණය උපයෝගී කර ගත් වේදිකා නිර්මාණය කරන ලදී.
- විදේශ රටවල කුළුබඩු ආනයනය කරන්නන්ගේ දත්ත පද්ධතිය 2022 වසර තුල ගොඩනඟන ලද අතර මේ යටතේ දේශීය ආනයනකරුවන් 99 දෙනෙකු හට ඉහත ආනයනකරුවන් සමඟ සබඳතා ඇති කර ගැනීමට අවස්ථාව සලසා දෙන ලදී.
- බාහිර ආයතනය විසින් සංවිධානය කරන ලද ව්‍යාපාර ප්‍රවර්ධන වැඩසටහන් 07ක් සඳහා ව්‍යාපාර උපදේශන ඒකකයේ නිළධාරීන් විසින් සම්පත් දායකත්වය ලබා දෙන ලදී.
- දිස්ත්‍රික් මට්ටමින් අපනයන කෘෂිකර්ම පාර්ශ්වකරුවන් ලියාපදිංචි කිරීම සඳහා පවත්වාගෙන යන දත්ත පද්ධතිය තුල 2022 වසර තුල පාර්ශ්වකරුවන් 180 දෙනෙකු ලියාපදිංචි වී ඇත.
- අපනයන කෘෂි බෝගයන්හි උසස්, ගුණාත්මක අස්වැන්නක් ලබා ගැනීම සඳහා ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය භාවිතය වඩා වැදගත් වන අතර, 2022 වසර තුල ගොවීන් වෙත උසස් ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය ලබා දීමේ අරමුණ ඇතිව, දෙපාර්තමේන්තු පැළ තවාන් 12 ක් හා පෞද්ගලික පැළ තවාන් 755 ක් මඟින් අවශ්‍ය රෝපණ ද්‍රව්‍ය සපුරා ගන්නා ලදී. 2022 වසරේදී ද දෙපාර්තමේන්තු ගස්නාව පැළ තවාන සඳහා මවු ශාක උද්‍යානයක් ස්ථාපිත කිරීම සිදු කරන ලද අතර, අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ගස්නාව සහ මාතලේ ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති පිහිටුවන ලද අතර අනෙකුත් මධ්‍යම පැළ තවාන් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සපයන ලදී.

  අපනයන කෘෂි පාර්ශ්වකරුවන් දැනුමෙන්, ආකල්පයෙන් හා කුසලතාවයෙන් පිරිපුන් බවට පත් කරලීමේ වගකීම දරන අපනයන කෘෂිකර්ම සේවා සංස්කරණ පුහුණු මධ්‍යස්ථානය 2022 වසර තුල සාමාන්‍ය පුහුණු වැඩමුළු හා පුහුණු වැඩසටහන් මෙන්ම මාර්ගගත ක්‍රමය ඔස්සේ ද පුහුණු වැඩසටහන් රාශියක් සාර්ථකව සම්පූර්ණ කරන ලදී. දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා සම්මන්ත්‍රණ , වැඩමුළු හා පුහුණු වැඩසටහන් අවශ්‍යතාවය පරිදි සිදු කරන ලද අතර, බාහිර ආයතන හා උසස් අධ්‍යාපන ආයතනවල ඉල්ලීම පරිදි විශේෂිත තාක්ෂණික පුහුණු සැසි හා වැඩසටහන් පුහුණු මධ්‍යස්ථාන තුල මෙන්ම අදාල ආයතන පරිශ්‍රවලදී ද පවත්වන ලදි. මෙහිදී කෘෂිකර්ම විද්‍යාල, ජාතික වැවිලි කළමනාකරණ ආයතනය, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, වර්ල්ඩ් විෂන් ලංකා හා කාර්මික විද්‍යාල ආදිය 2022 වසරේ සේවා සංස්කරණ පුහුණු මධ්‍යස්ථානයේ තාක්ෂණික පුහුණු ලබාගත් බාහිර සේවා ලාභී ආයතන ලෙස දැක්විය හැක. එමෙන්ම මෙම ආයතනයේ ප්‍රමුඛ අරමුණක් වන ගොවි පුහුණු පැවැත්වීම 2022 වසර තුල පැවැතුන ප්‍රවාහන දුෂ්කරතාවලටද මුහුණ දෙමින් මාතලේ, මහනුවර හා

කුරුණෑගල දිස්ත්‍රික්ක කේන්ද්‍ර කර ගනිමින් ඉහළ ආකර්ෂණයක් යටතේ පවත්වන ලදී. මෙම සියල්ලටම අමතරව, පශ්චාත් කොවිඩ් තත්ත්වයක් තුල ඉතා ඉහළ සාර්ථකත්වයක් යටතේ මාර්ගගත පුහුණු වැඩසටහන් වඩාත් විධිමත් ලෙසින් අභහරුවාදා ගොවි පුහුණු වැඩසටහන් ලෙසින් හා බ්‍රහස්පතින්දා අපනයන කෘෂිකර්ම ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් ලෙසින් වැඩසටහන් මාලා 02 ක් සජීවීව මුහුණු පොත හා යූ ටියුබ් නාලිකා හරහා විකාශනය කරන ලදී. එහිදී වසර පුරා මාර්ගගත පුහුණු 41 ක් පවත්වා ප්‍රතිලාභීන් 92,418 දෙනෙකු බිහි කර ඇත. ඊට අමතරව 2022 වසරේ පුහුණු වැඩසටහන් 16 ක් භෞතික වශයෙන් පවත්වා පුහුණුලාභීන් 709 දෙනෙකු සඳහා අපනයන කෘෂි බෝග පුහුණුව ලබා දෙන ලදී.

- වැවිලි අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද අපනයන කෘෂි බෝග ආර්ථික ගෙවතු, අපනයන බෝග ප්‍රවර්ධන වැඩසටහන හා ගෙවතු සඳහා කහ/ඉඟුරු පැළ ලබා දීමේ උප වැඩසටහන් දෙපාර්තමේන්තුව මඟින් 2022 වසර තුල ක්‍රියාත්මක කරන ලදී. ආර්ථික ගෙවතු වගා වැඩසටහන යටතේ වගා කළ හැකි වපසරිය අවම වශයෙන් පර්චස් 20 ක් හා උපරිමය පර්චස් 39 ක් හිමි අපනයන කෘෂි බෝග වගා කිරීමට කැමැත්තක් දක්වන ප්‍රතිලාභීන් සඳහා අපනයන කෘෂි බෝග පැළ /බීජ ලබා දෙන ලදී. අපනයන කෘෂි බෝග ජනතාව අතර ප්‍රචලිත කිරීම හා හඳුන්වාදීම අරමුණු කර ගනිමින් අපනයන බෝග ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ රාජ්‍ය/ රාජ්‍ය නොවන / පුද්ගලික ආයතන හා විවිධ ප්‍රජා සංවිධාන සමිති මඟින් සිදු කරන ඉල්ලීම් සඳහා මේ යටතේ පැළ ලබා දෙන ලදී. නාගරික හා අර්ධ නාගරික නිවාස ඉලක්ක කර ගනිමින් ගෘහස්ථ පරිභෝජන සඳහා අවශ්‍ය කහ සහ ඉඟුරු අවශ්‍යතාවය ගෙවත්ත තුලින්ම නිෂ්පාදනය කිරීම මෙමඟින් බලාපොරොත්තු වන ලදී. ඒ යටතේ එක් ගෘහයක් සඳහා අවශ්‍යතාවය පරිදි කහ පැළ උපරිමය දක්වාත් , ඉඟුරු පැළ 05 ක් දක්වා නොමිලයේ නිකුත් කරන ලදී. මේ යටතේ කහ සහ ඉඟුරු පැළ ගොවි සමිති , ග්‍රාමීය සංවිධාන රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික ආයතන ඉල්ලීම් සඳහා ලබා දෙන ලදී.

- ආර්ථික ඵලදායීතාවයෙන් යුතු අපනයන කෘෂි බෝග ආදර්ශ ගෙවතු ස්ථාපිත කිරීමේ වැඩසටහන යටතේ ගෙවතු 32,198 ක් ස්ථාපිත කරන ලද අතර ඒ යටතේ හෙක්ටයාර 1364.4 ක භූමි ප්‍රමාණයක් සඳහා අපනයන කෘෂි බෝග පැළ ලබා දෙන ලදී. මෙහිදී ගම්මිරිස් පැළ 609, 396 ක්, කුරුඳු පැළ 3,381,750 ක්, වැනිලා දඬු 5,850 ක් , කෝපි පැළ 89,839 ක්, කරඳමුංගු පැළ 38,344 ක් කහ පැළ 1,416,825 ක් ඉඟුරු පැළ 214,480 ක් සාදික්කා පැළ 11, 190 ක් කොකෝවා පැළ 17,622 ක් හා පුවක් 656,151 , කරාඹු 6522 , ගොරකා 8720 ක් ප්‍රතිලාභීන් වෙත ලබා දෙන ලදී. මේ සඳහා මූල්‍ය ප්‍රතිපාදන වැවිලි අමාත්‍යාංශය මඟින් ලබා දෙන ලදී.

- තවද, අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද අපනයන කෘෂි කලාප වැඩසටහන යටතේ ඒ ඒ ප්‍රදේශයට ආවේණික හා නිර්දේශිත වූ පාරිසරික , සාමාජීය හා කෘෂිකාර්මික

කරුණු සැලකිල්ලට ගෙන, ආර්ථිකමය වශයෙන් ඉහළ ප්‍රතිලාභයක් ලබා ගැනීම සඳහා අපනයන විභවයක් පවතින බෝග වර්ග හඳුනාගෙන අපනයන කෘෂි බෝගවල ජාතික නිෂ්පාදන ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් 2022 වසර තුලදී ද ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ අක්කර ¼ සිට අක්කර 05 දක්වා කුරුඳු සහ ගම්මිරිස් පැළ ලබා දෙන ලදි. මෙම ව්‍යාපෘතිය දිස්ත්‍රික්ක 17 ක් තුල ක්‍රියාත්මක කරන ලද අතර, අපනයන කෘෂි කලාප 334 ක් සඳහා අපනයන කෘෂි බෝග පැළ ලබා දුන් අතර ඒ යටතේ පැළ 11,959,072 ක් ලබා දෙන ලදී.

2022 වසර තුල අපනනයන කෘෂි බෝග ආශ්‍රිතව විවිධ විෂයයන් ඔස්සේ සිදුකරනු ලැබූ පර්යේෂණ මඟින් සාර්ථක ප්‍රතිඵල රාශියක් ලබාගත හැකිවිය. එසේ ලබාගත් ප්‍රතිඵල පහත පරිදි වේ.

- බීජ රයිසෝම අස්වනු නෙලාගන්නා කාලය අනුව ඉඟුරු බෝගයේ වර්ධන හා අස්වනු ලක්ෂණ වෙනස් වන ආකාරය පරීක්ෂා කිරීම.

බීජ රයිසෝම වල වයස ඉන් හටගන්නා ඉඟුරු පඳුරු වල පත්‍ර සංඛ්‍යාව, ව්‍යාජ කඳන් සංඛ්‍යාව, රයිසෝම වල අමු බර හා වියලි බර කෙරෙහි පැහැදිලි බලපෑමක් ඇතිකරන බව මෙම අධ්‍යයනයේදී හඳුනාගන්නා ලදී. තවද වයස මාස 7 හෝ ඊට අඩුවෙන් නෙලාගන්නා බීජ රයිසෝම සිටුවීම සඳහා භාවිත නොකල යුතු බවද පැහැදිලි විය.

- කහ බීජ පැල වල වර්ධනය සඳහා විකල්ප බඳුන් මාධ්‍ය හා පෝෂණ ප්‍රභව පිලිබඳ අධ්‍යයනය කිරීම.

මෙහිදී විවිධ බඳුන් මාධ්‍ය සමඟ විවිධ පෝෂණ මිශ්‍රණ සමඟ කහ බීජ පැල වල වර්ධක ලක්ෂණ වල වෙනස්වීම නිරීක්ෂණය කරන ලදී. ලැබුන ප්‍රතිඵල විශ්ලේෂණයේදී පඳුරේ උස, පඳුරේ මුළු පත්‍ර සංඛ්‍යාව, පත්‍ර වල අමු හා වියලි බර, අලුතෙන් වර්ධනය වූ රයිසෝම වල අමු හා වියලි බර යනාදී සියලු වර්ධන හා අස්වනු ලක්ෂණ පෝෂණ ප්‍රභවය ලෙස යාරමිලා සංකීර්ණ (yaramilacomplex) යෙදූ විට වඩාත් වැඩි බව පැහැදිලිව නිරීක්ෂණය කරන ලදී. ඉන් පසුව වඩාත් හොඳින් වර්ධන හා අස්වනු ලක්ෂණ පිලිවෙලින් TSP + යුරියා + MOP මිශ්‍රණය හා ඇල්බර්ට් ද්‍රාවණය යෙදූ බඳුන් මාධ්‍ය වලින් ලබාගත හැකි බව පැහැදිලි විය.

- ගම්මිරිස් රෝපණ ද්‍රව්‍ය වල වර්ධනය සඳහා විවිධ කාබනික හා අකාබනික දියර පොහොර වල බලපෑම අගය කිරීම.

මෙහිදී ලද ප්‍රතිඵල අනුව අකාබනික පොහොර වර්ග වන Albert ද්‍රාවනය 3 න් වතාවක් යෙදීම මඟින් හෝ GreenBeper ද්‍රාවණය දෙවතාවක් යෙදීම මඟින් මේ සඳහා ගොම පොහොර යෙදීම අවශ්‍ය නොවන බව නිරීක්ෂණය කරන ලදී.

- ගම්මිරිස් රෝපණ ද්‍රව්‍ය සඳහා විකල්ප බඳුන් මාධ්‍ය මිශ්‍රණ හඳුනාගැනීම.

පරීක්ෂණය මඟින් අර්ධ වශයෙන් දහනය කරන ලද දහයියා සහ දිරූ ලී කුඩු යන ද්‍රව්‍ය ගම්මිරිස් බඳුන් මාධ්‍ය සෑදීමට භාවිතාකරන කොහු බත් වෙනුවට පහසුවෙන් යෙදිය හැකි බව අනාවරණය විය.

- ගම්මිරිස්, කෝපි හා කහ බෝග වල රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා කුකුල් පොහොර භාවිතා කිරීම.

ඉහත අධ්‍යයනයේදී රෝපන ද්‍රව්‍ය වල වර්ධන ලක්ෂණ සාපේක්ෂව අඩුවීම මෙන්ම පැල මියයාමේ ප්‍රතිශතය ද සාපේක්ෂව වැඩිවීම නිසා බඳුන් මාධ්‍ය සැදීම සඳහා කුකුල් පොහොර භාවිත කිරීම ප්‍රතිඵලදායක නොවන බව පැහැදිලි විය.

- ගම්මිරිස් බෝගයේ පටක රෝපණය මඟින් හා තනි ගැටයක් සහිත අතු කැබලි මඟින් නිපදවන රෝපණ ද්‍රව්‍ය ක්ෂේත්‍රයේදී පෙන්වන වර්ධක හා අස්වනු ලක්ෂණ සංසන්දනය කිරීම.

මෙම රෝපණ ද්‍රව්‍ය ආකාර දෙකම ක්ෂේත්‍රයේදී ස්ථාපන ප්‍රතිශතය, වර්ධනය හා අස්වනු ලබාදීම යන ලක්ෂණ වලදී පැහැදිලි වෙනසක් නොපෙන්වූ බැවින් පටක රෝපණය මඟින් නිපදවන රෝපණ ද්‍රව්‍යද සාමාන්‍ය ලෙස වාණිජ වගාවන් සඳහා භාවිත කල හැකි බව හඳුනා ගන්නා ලදී.

- අම්පාර ප්‍රදේශයේ වාර්ථා වූ කහ බෝගයේ පත්‍ර ලප රෝගය පාලනය සඳහා විවිධ දිලීර නාශක වල බලපෑම පරීක්ෂා කිරීම.

මෙහිදී බීජ ප්‍රතිකාරක ලෙස මැන්කොසෙබ් 80% WP (2400ppm) හෝ කැප්ටාන් 50% WP (3040 ppm) යෙදීම හෝ පත්‍ර වලට ඉසින ප්‍රතිකාරක ලෙස 1% බෝඩෝ මිශ්‍රණය හෝ මැන්කොසෙබ් 80% WP (3040 ppm) සිටුවා දින 45 කදී (දෙවතාවක් දින 14 කට වරක් බැගින්) ඉසීම හා නැවත දින 90 කදී (දෙවතාවක් දින 14 කට වරක් බැගින්) යෙදීම මඟින් රෝගය හොඳින් පාලනය කල හැකි බවත් රෝගය ඇතිවීමේ ප්‍රතිශතය (Percentage of Disease Incidence–PDI) අඩු මට්ටමකට පවත්වා ගත හැකි බවත් නිරීක්ෂණය කරන ලදී. මේ නිසා රෝගය සඳහා ආරක්ෂක උපක්‍රමයක් ලෙස මැන්කොසෙබ් 80% WP (2400ppm) හෝ කැප්ටාන් 50% WP (3040 ppm) යෙදීම හෝ පත්‍ර වලට ඉසින ප්‍රතිකාරක ලෙස 1% බෝඩෝ මිශ්‍රණය හෝ මැන්කොසෙබ් 80% WP (3040 ppm) සිටුවා දින 45 කදී (දෙවතාවක් දින 14 කට වරක් බැගින්) ඉසීම හා නැවත දින 90 කදී (දෙවතාවක් දින 14 කට වරක් බැගින්) ඉසීම කහ පත්‍ර ලප රෝගය පාලනය සඳහා නිර්දේශයක් ලෙස ලබාදිය හැක.

- විවිධ පශ්චාත් අස්වනු තාක්ෂණික ක්‍රම මඟින් වියලුනු කහ නිෂ්පාදනය කිරීමේදී දේශීය හා ඉන්දියානු කහ වල ගුණාත්මයේ ඇතිවන වෙනස්කම් අධ්‍යයනය කිරීම.

කහ රයිසෝම ඇඟිලි හා පෙති ලෙස විවිධ තැම්බීමේ හා වියළීමේ ක්‍රම භාවිතාකරමින් සකස් කිරීමේදී දේශීය හා ඉන්දියානු කහ වල ගුනාත්මයේ වෙනස්වීම් පරීක්ෂා කල විට වියලීමට පෙර තැම්බීම ගුණාත්මය වැඩිවීම කෙරෙහි පැහැදිලි බලපෑමක් ඇති බව හඳුනා ගන්නා ලදී. තවද උණුසුම් වාෂ්ප මඟින් තම්බා පෙතිකපා කෘතීම වියලනයක් මඟින් වියලාගැනීම මඟින් ඒවායේ කර්කියුමින් ප්‍රමාණයක් ලැබෙන බවද, ඉන්දියානු කහ වල අඩංගු කර්කියුමින් ප්‍රමාණය දේශීය කහ වලට වඩා අඩු බවද පැහැදිලි විය. (කර්කියුමින් - දේශීය කහ 5.21%, ඉන්දියන් කහ 3.16%)

- පයිපරීන් අඩංගු කරන ලද කර්කියුමින් කරල් (capsules) නිෂ්පාදනය කිරීම.

මෙම පරීක්ෂණයේදී ගම්මිරිස් වලින් නිස්සාරණය කරන ලද පයිපරීන් හා කහ වලින් නිස්සාරණය කරන ලද කර්කියුමින් එකතුකර පයිපරීන් අඩංගු කර්කියුමින් කරල් (capsules) සාර්ථකව නිෂ්පාදනය කරගැනීමට හැකිවිය.

- ගම්මිරිස් වලින් ඔලියෝරෙසින් නිෂ්පාදනයේදී සාම්ප්‍රදායික උණුසුම් කිරීම වෙනුවට ඔහ්මික් (Ohmic) උණුසුම් කිරීම මඟින් ඇතිවන වෙනස අධ්‍යයනය.

මෙහිදී සාම්ප්‍රදායික ක්‍රමයට සාපේක්ෂව ඔහ්මික් උණුසුම් කිරීමේදී ඔලියෝරෙසින් හා පයිපරීන් නිෂ්පාදනයේ පැහැදිලි වැඩිවීමක් සිදුවිය. නිස්සාරනයෙන් පසු ලබාගත් කුඩු සහ අපද්‍රව්‍ය වල ක්ෂුද්‍ර ව්‍යුහ පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය කරන ලද්දේ ඔහ්මික් උණුසුම් කිරීම මඟින් සෛල බිත්ති වල කුඩා සිදුරු හා ඉරිතැලීම් ඇතිවන බවත් ඒ මඟින් ද්‍රාවක හා ඔලියෝරෙසින් අංශු පිටතට ගමන් කිරීම පහසු කරවන බවත්ය.

- ඉසින-වියලීම (Spray drying) හා ශීතන-වියලීම (Freeze drying) මඟින් ගම්මිරිස් ඔලියෝරෙසින් කැප්සියුල්ගත කිරීම.

පරීක්ෂණ ප්‍රතිඵල මඟින් පැහැදිලි වූයේ ගම් ඇරබික් වාහක මඟින් සිදුකරන ඉසින-වියළීමේ ක්‍රමයට අනුගතව වඩාත් සුදුසු ඔලියෝරෙසින් සාන්ද්‍රණය 15% (w/w) බවයි. නවීකරණය කරන ලද පිෂ්ටය, මෝල්ටෝඩෙක්ස්ට්‍රින්, සහ මේවායේ මිශ්‍රණ ලෙස භාවිතකරන බඳවා ගන්නා ද්‍රව්‍ය සංසන්දනය කලවිට ලැබෙන අස්වැන්න හා කප්සියුල්ගත කිරීමේ කාර්යක්ෂමතාව අනුව ඔලියෝරෙසින් කැප්සියුල්ගත කිරීම සඳහා වඩාත් සුදුසු බඳවාගන්නා ද්‍රව්‍ය ලෙස ගම් ඇරබික් සැලකිය හැක.

- වියලි කළු ගම්මිරිස් වලින් පයිපරීන් වෙන්කරගැනීම සඳහා ක්‍රමෝපායයන් වැඩිදියුණු කිරීම.

කළු ගම්මිරිස් වලින් පයිපරීන් වෙන්කර ගැනීමේදී වැඩි නිස්සාරණය කිරීමේ හැකියාවක් මෙන්ම ඉහල සන්ශුද්ධතාවයක්ද (86.5% ට වැඩි) ලබාගැනීමේ වඩාත් සුදුසු ක්‍රම ලෙස; අයිසොප්‍රෝපයිල් ඇල්කොහොල් සමඟ ජල සනීභවන නිස්සාරණය, අයිසොප්‍රෝපයිල් ඇල්කොහොල් සමඟ සොක්ස්ලට් නිස්සාරණය හා එතනෝල් සමඟ සොක්ස්ලට් නිස්සාරණය යන ක්‍රම සුදුසු බව හඳුනාගන්නා ලදී. එහිදී ලබාගත් සෑම නියැදියකම සංශුද්ධතාව 86.5% ට වඩා ඉහල අගයක් පෙන්වීය.

- අමු කහ රයිසෝම මඟින් කර්කියුමින් නැනෝ අංශු සංශ්ලේෂණය.

UV දෘශ්‍ය වර්ණාවලීක්ෂය, FTIR විශ්ලේශකය හා අංශු ප්‍රමාණී විශ්ලේශකය යන උපකරණ භාවිතයෙන් නැනෝ කර්කියුමින් වල ලක්ෂණ හඳුනාගන්නා ලදී. එම ක්‍රම අනුසාරයෙන් සාර්ථකව දේශීයව වගාකරන ලද කහ රයිසෝම වලින් නැනෝ කර්කියුමින් නිෂ්පාදනය කරන ලදී.

- තෝරාගත් කුරුඳු දර්ශක වල ඇති කැබලි වලින් අංකුර ඇතිකිරීම සඳහා ශාක වර්ධක ද්‍රව්‍ය වල බලපෑම පරීක්ෂා කිරීම.

මෙහිදී වෙළඳපොලේ ඇති ගිබරලික් අම්ලය හා BAP මිශ්‍රණයේ 100, 200,300, සහ 400 ppm හෝර්මෝන සාන්ද්‍රණ භාවිත කල අතර එම සාන්ද්‍රණ වලදී අංකුර ඇතිකිරීම උත්තේජනය ඇතිවීම සඳහා බලපෑමක් නැති බව පැහැදිලි විය.

- වැලි ස්වභාවයේ ලක්ෂණ සහිත කුරුඳු පොතු පටක වල රසායනික හා මූල ද්‍රව්‍ය සංයුතිය හඳුනා ගැනීම.

අධ්‍යයනයේදී වැලි ස්වභාවයේ ලක්ෂණ සහිත කුරුඳු පොතු වල සාමාන්‍ය කුරුඳු වලට වඩා කැල්සියම් අඩංගු වන බවත් කඳන් මේරීම සමඟ මෙම ස්වභාවය පැහැදිලිව වැඩිවන බවත් අනාවරණය විය.

- කුරුඳු බෝගයේ වර්ධන හා අස්වනු ලක්ෂණ කෙරෙහි වෙළඳපොලේ ඇති කුරුඳු පොහොර මිශ්‍රණ වල බලපෑම පරීක්ෂා කිරීම.

දෙපාර්තමේන්තු නිර්දේශය වන වසරකට හෙක්ටයාර එකකට 900kg වෙනුවට විකල්ප පොහොර මිශ්‍රණයක් ලෙස සංයුක්ත පොහොර (N:P:K 21;07:14) වසරකට හෙක්ටයාර එකකට 700kg ක් යෙදීම සුදුසු බවත් ඒ මඟින් ලැබෙන අස්වැන්න නිර්දේශිත මිශ්‍රණයට සමාන බවත් හඳුනාගන්නා ලදී.

- කුරුඳු පැල වල වර්ධනය සඳහා විවිධ බඳුන් මාධ්‍ය වල බලපෑම පරීක්ෂා කිරීම.

බඳුන් මිශ්‍රණය සඳහා අර්ධ ලෙස දහනය කරන ලද කුරුඳු කඳන් අඟුරු යෙදුවිට කුරුඳු බීජ ප්‍රරෝහණ ප්‍රතිශතයේ සාපේක්ෂ අඩුවීමක් ඇති බව නිරීක්ෂණය කරන ලදී.

- කුරුඳු බෝගයේ වර්ධන හා අස්වනු කෙරෙහි විවිධ රෝපණ ද්‍රව්‍ය හා ඒ සඳහා යොදන කාබනික හා අකාබනික පොහොර අනුපාතයන්ගේ බලපෑම අධ්‍යයනය කිරීම.

මෙහිදී වර්ධක ප්‍රචාරණයෙන් ලබාගත් පැල වලට වැඩි පොහොර ප්‍රමාන යෙදුවිට ඉහල වියලි පොතු අස්වැන්නක් ලබාගත හැකිවිය. එසේම සාමන්‍ය කුරුඳු දර්ශ වලට වඩා ශ්‍රී ගැමුණු බීජ පැල වලින්ද වැඩි පොතු අස්වැන්නක් ලබාගත හැකි විය.

- කුරුඳු පත්‍ර අංගමාරය රෝගයට හේතුවන ව්‍යාධිජනක ක්ෂුද්‍ර ජීවීන් හඳුනාගැනීම හා එම ජීවීන් දිලීරනාශක වලට අසංවේදීතාව සඳහා නලස්ථ අධ්‍යයනයක් සිදුකිරීම.

පරීක්ෂණයේ දී Koch's උපකල්පන අනුව රෝගය සඳහා හේතුවන ව්‍යාධිජනකයා ලෙස Colletotricumgloeoporioides බව තහවුරු විය.

- කුරුඳු කොළ තෙල් වල ප්‍රමාණය හා ගුණාත්මය කෙරෙහි අංශු වර්ගය හා ආසවන කාලයෙහි බලපෑම පරීක්ෂා කිරීම.

මෙම අධ්‍යයනයේදී කුරුඳු කොළ තෙල් වල ප්‍රමාණය හා ගුණාත්මය කෙරෙහි පත්‍ර අංශු ප්‍රමාණය හා ආසවන කාලයෙහි බලපෑමක් ඇතිබව හඳුනාගන්නා ලදී.

පර්යේෂණ ප්‍රකාශන

01. යටවත්ත වී. ජේ., මොහොට්ටි. ඒ. ජේ. සහ සුබසිංහ එච්. එම්. පී. ඒ (2022) “බීජ ඉහුරු සඳහා (*Zingiber officnale* Roscoe)අස්වනු නෙලීමට සුදුසු නිවැරදි වර්ධක අවධිය නීර්ණය කිරීම”. කෘෂිකර්මය සහ පරිසරය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය, කෘෂිකර්ම පීඨය, ශ්‍රී ලංකාව, රුහුණු විශ්ව විද්‍යාලය.
02. ඉඳුරුව වී. ඒ. ඩී. සී. එස්. අයි සහ ජිටනිට් ඩබ්. (2022) “ගම්මිරිස් අස්වැන්න, පයිපරීන් අන්තර්ගතය, ඔලියොරෙසින් නිස්සාරක තුල ඇති වාෂ්පශීලී සහ වාෂ්පශීලී නොවන සංඝටක කෙරෙහි අංශුවල විශාලත්වය සහ ඝන ද්‍රාවක අනුපාතයෙහි බලපෑම”. කෘෂිකාර්මික ව්‍යවහාරික ඉංජිනේරු විද්‍යාව. 38 (1): 145-153 https://doi.org./10.1303/aea.14736
03. ඉඳුරුව වී. ඒ. ඩී. සී. එස්. අයි සහ ජිටනිට් ඩබ්. සහ Lorjaroenphon. Y. (2022). “සාම්ප්‍රදායික උණුසුම හා සසඳන විට ගම්මිරිස් (*Piper nigrum* L.) ඔලියොරෙසින් නිස්සාරනය සඳහා ඕමික් උණුසුම යෙදීම.” ආහාර සැකසීම හා සංරක්ෂණය පිළිබඳ සඟරාව E 16568 https://doi.org./10.1111/jfpp.16568
04. ඉඳුරුව වී. ඒ. ඩී. සී. එස්. අයි. සහ ජිටනිට් ඩබ්. (2020) “ඕමික් තාප ආධාරක ද්‍රාවක නිස්සාරණය මගින් ගම්මිරිස් ඔලියොරෙසීන් නිස්සාරණය කිරීම”. කැසට්සාට් විශ්ව විදයාලයේ 17 වැනි ජාතික සම්මන්ත්‍රණ කාර්ය සටහන (Kamphaeng Saen) (පිටු 3008-3015) කැසට්සාට් විශ්ව විද්‍යාලය, තායිලන්තය. Kamphaeng Saen Campous, Nakhon Pathom, Thailand
05. ඉඳුරුව වී. ඒ. ඩී. සී. එස්. අයි. (2022). ගම්මිරිස් (*Piper nigrum* L.) “ඔලියොරෙසින් නිස්සාරණය සහ ආවරණය (Encapsulation) කිරීම” පිළිබඳ ආචාර්ය උපාධි නිබන්ධනය, ආහාර විද්‍යා හා තාක්ෂණ දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම පීඨය, කැසට්සාට් විශ්ව විද්‍යාලය, බැංකොක්, තායිලන්තය.
06. කරුණාතිලක ඩබ්. ඩී. කේ., හෙට්ටිආරච්චි එස්. එස්., රත්නායක ආර්. එම්. යූ. එස්. කේ.,“අගය එකතුකළ නිෂ්පාදන සකස් කිරීම සඳහා උදුනේ වියලන ලද අමු සියඹලා (Tamarindus indica) කුඩුවල භෞතික රසායනික විශ්ලේෂණය”, විද්‍යා තාක්ෂණ, ඉංජිනේරු සහ ආර්ථිකය පිළිබඳ ජාත්‍යන්තර සමුළුව 2022, හංගේරියාව, 17 පිටුව.
07. කරුණාතිලක ඩබ්. ඩී. කේ., හෙට්ටිආරච්චි එස්. එස්, අමරකෝන් ආර්. (2022) “සියඹලා(*Tamarindus indica)* කුඩුවල පෝෂණ ගුණය මත වියළන උෂ්ණත්වයේ බලපෑම”, ආහාර, පෝෂණය, සෞඛ්‍ය සහ ජීවන රටාව පිළිබඳ 4 වැනි ජාත්‍යන්තර සමුළුව. 2022 ජූලි සාරාංශ පොත, පිටුව 15
08. සේනානායක අයි. කේ., මුණසිංහ එස්. එස්., දිසානායක ඩී. ජී. එච්. එම්. කේ, ප්‍රියදර්ශනී ටී. ඩී. සී. , දිසානායක ඩී. එම්. ඩී සහ මුණවීර ටී. අයි. කේ. (2021), “රූප විද්‍යාත්මක ලක්ෂණ සහ අනුක සලකුණු භාවිතා කරමින් සාදික්කා ලිංග නීර්ණය කිරීම (*Myristica fraqrance* Houtt)” 13 වන වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණ කාර්ය සටහන්, කෘෂිකර්ම පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය.
09. විශාදිනී එල්., වික්‍රමසූරිය ඒ., බන්දුප්‍රිය එච්., ආරියවංශ කේ., විමලරත්න ඩබ්., සෙනවිරත්න ජේ., මුණසිංහ එස්. එස්., දිසානායක ඩී. ජී. එච්. එම්. කේ, සිල්වා ටී. ඩී. (2021) “PCR මත පදනම් වූ SSR සලකුණු භාවිතා කරමින් ශ්‍රී ලංකාවේ පයිපර් විශේෂ වල ජාන විවිධත්වය විශ්ලේෂණය.”
10. විමලරත්න ඩබ්. ජී. එන්. ඒ., ලක්ෂිකා ජේ. එම්. වී., වෛද්‍යතිලක එච්. ඒ. එන්. එම්., සෙනවිරත්න ජේ. එම්.,දිසානායක ඩී. ජී. එච්. එම්. කේ.,මුණසිංහ එම්.එස්. එස්., සෙනවිරත්න එච්. එම්. ජී. අයි. සී. කේ., වික්‍රමසූරිය ඒ. එම්., ආරියවංශ කේ. ජී. එස්. යූ., බන්දුප්‍රිය එච්. ඩී. ඩී., සිල්වා ටී. ඩී., “රූපමිතික විශලේෂණ භාවිතාකරමින් ශ්‍රී ලංකාවේ කොලොන්න ප්‍රදේශයේ

වැවෙන *Piper nigrum* දර්ශ වල ජාන විවිධත්වය පිළිබඳ මූලික තක්සේරුව"41 වැනි වාර්ෂික සැසිවල ක්‍රියාදාමයන්, ජීව විද්‍යා ආයතනය, ශ්‍රී ලංකාව, 2021 සැප්තැම්බර් 24

11. පබසරා පී. ඩී. කේ., සමරවීර ඩී. එන්., "කුරුඳු(*Cinnamomum zeylanicum* Blume) සඳහා භාවිතා වන තවාන් බඳුන් ලෙස කොකෝ පීට් පෙති වල යෝග්‍යතාවය පිළිබඳ අධ්‍යනය." ජාත්‍යන්තර විවෘත විශ්ව විද්‍යාල පර්යේෂණ සැසියේ ප්‍රකාශනය JOURS(2022 දෙසැම්බර් 10 සහ 11)
12. මධුභාෂිණී ඩබ්. කේ. ඒ., වීරසූරිය එස්. එන්., ගලහිටිගම ජී. ඒ. එච්., (2022) "ශ්‍රී ගැමුණු සහ ශ්‍රී විජය යන කුරුඳ ප්‍රභේද වල මල් හට ගැනීම, පරාගනය සහ පල හටගැනීම සම්බන්ධ ලක්ෂණ සංසන්ධනාත්මකව අධ්‍යනය කිරීම". උපාධි අපේක්ෂක පර්යෙෂණ සම්මන්ත්‍රණය, කෘෂිකර්ම විද්‍යා පීඨය, ශ්‍රී ලංකා සබරගමු විශ්ව විද්‍යාලය
13. පතිරගේ එස්. එස්. එස්., තරංගා කේ. එච්. ජී. එම්. සහ අම්පිටියවත්ත ඒ. ඩී., "කුරුඳු වල කාබනික යෙදවුම් ඇගයීම (*Cinnamomum zeylanicum* Blume)", වියලි කලාපීය කෘෂිකර්මය පිළිබඳ 8 වැනි ජාත්‍යන්තර සම්මන්ත්‍රණය, 2022 සැප්තැම්බර් 14, කෘෂිකර්ම පීඨය යාපනය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
14. නයේන්ද්‍ර ඩබ්. ජී. එන්., තරංගා කේ. එච්. ජී. එම්. සහ යාපා පී. අයි., "පෝෂ්‍ය පදාර්ථ රඳවා තබාගැනීම හා මුදා හැරීම පිළිබඳ කුරුඳු දැව ජෛව අඟුරු සකස්කිරීමේ ක්‍රමවේදයේ බලපෑම." වියළි කලාපීය කෘෂිකර්මය පිළිබඳ 8 වැනි ජාත්‍යන්තර සම්මන්ත්‍රණය,2022 සැප්තැම්බර් 14, කෘෂිකර්ම පීඨය,යාපනය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
15. මධුරංගි එච්. එම්. ටී. ටී., වනිගතුංග ආර්. පී., ජයසිංහ ජී. ජී., අත්තනායක ආර්. එන්., "කුරුඳු (*Cinnamomum zeylanicum* Blume)පත්‍ර අංගමාරය ඇතිකරන ව්‍යාධිජනක දිලීරය හඳුනාගැනීම සහ එය පර්යේෂණාගාර තත්ව යටතේ ටෙබ්‍යුකොනසෝල් දිලීර නාශකයට දක්වන සංවේදීතාවය අධ්‍යයනය", දිලීර විද්‍යාව සහ ශාක ව්‍යාධි විද්‍යාව සඳහා වූ ශ්‍රී ලංකා සංගමයේ 2 වැනි ජාතික සම්මන්ත්‍රණයේ ප්‍රකාශනය SLAMPP (2022) පිටුව 18 (2022)
16. සිල්වා එන්. එස්. ඩබ්. ටී. එච්., මදුරංගි එච්.එම්. ටී. ටී., ජයසිංහ ජී. ජී., රත්නායක ඒ. එම්. ජී. එන්. සහ ප්‍රේමතිලක යූ. ජී. ඒ. ටී., "කුරුඳු බෝගයට වැලඳෙන සුදු මුල් රෝගයේ හේතුකාරක දිලීරය වන (*Rigidoporus microporus*) රිජිඩොපෝරස් හි මයිසීලියමේ ලක්ෂණ හඳුනාගැනීම සහ පර්යේෂණාගාර තත්ව යටතේ තෝරාගත් දිලීර නාශක වලට එරෙහිව රෝග කාරකයාගේ වර්ධනය පිළිබඳ අධ්‍යනය". කෘෂිකර්මය පිළිබඳ 5 වන ජාතික සම්මන්ත්‍රණය (5th NSA 2022) කෘෂිකරම පීඨය, නැගෙනහිර විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව , පිටුව 47(2022)
17. විදානපතිරණ සී. යූ., යැප් එස්. ඒ., මැන්ෆ්‍රෙඩ් ආර්. යුලිට්ස්කා, ජයසිංහ ජී. ජී., " ශ්‍රී ලංකාවේ සත්‍ය කුරුඳු *Cinnamomum verum* J. Presl. ශාකයේ පලිබෝධකයෙක් ලෙස දකුණු ආසියාණු කලාපයේ *Helionothrips annosus* වැන්ග්, 1993 (තයිසැනොප්ටෙරා, ත්‍රිපිඩේ කුලය) ගේ පළමු වාර්තා කිරීම සහ නැවත විස්තර කිරීම" 18 (6) වැනි පිරික්සුම් ලැයිස්තුව, (Check list 18 ()6) (2022) : 1195-120 I https://doi.org/10.15560/18.6.1195
18. ශානිකා එම්. කේ. එස්., විදානපතිරන සී. යූ., රූපසිංහ සී. පී., මධුරංගිඑච්. එම්. ටී. ටී., ජයසිංහ ජී. ජී., "ශ්‍රී ලංකාවේ කුරුඳු (*Cinnamomum zeylanicum* Blume) තවාන් සහ වගාවන්හි පත්‍ර කණින්නා (*Acrocercops* spp.) සහ පැළ මැක්කා (*Helionothrips annosus*වැන්ග්) මර්ධනය සඳහා කෘමීන් ඇලෙන උගුල් භාවිතය", කෘෂිකාර්මික ඉංජිනේරු විද්‍යාව සහ පාරිසරික තාක්ෂණය පිළිබඳ උපාධි අපේක්ෂකයන්ගේ පර්යේෂණ සමුළුව, 2022, රුහුණු විශ්ව විද්‍යාලය
19. විජේරත්න ආර්. එම්. එන්., විජේවීර ඒ. ඒ., මාපා එම්. එස්. ටී., "*Candida albicans* දිලීර විශේෂයට එදිරිව සිට්‍රොනෙල්ලා (*Citronella nardus* and *Cymbopogon winterianus*) හි තෝරාගත් ප්‍රවේශයන් ගේ තෙල්වල ගුණාත්මය හා ප්‍රති දිලීරක ක්‍රියාකාරකම පිලිබඳ නිර්ණය

කිරීම" ICIET/ ජෛව තාක්ෂණය, ජෛව ඉංජිනේරු විද්‍යාව සහ කාර්මික ජෛව සැකසුම, පිටුව 201 (2022)

20. නිර්මන්ත එම්. ඒ., විජේවීර ඒ. ඒ., සින්තුජා එල්. පී., (2022) "පිළීගැන්වීමට සූදානම් කළ කුරුඳු (*Cinnamomum zeylanicum* Blume) අඩංගු වරකා පානයක් වැඩිදියුණු කිරීම සහ තත්ව ඇගයීම", තාක්ෂණික වැඩි දියුණුව හා නවොත්පාදන පිළිබඳ සමුළුව 2022 (TechInn 2022) තාක්ෂණ පීඨය, යාපනය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව.
21. විජේවීර ඒ. ඒ., විදානපතිරණ සී. යූ., පෙරේරා ජී. එස්. එම්., සහ ජයසිංහ ජී. ජී., (2022) "ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ අගය දාමය ඔස්සේ සැකසූ කුරුඳු වල ගුණාත්මක විචලනය", කෘෂිකර්මය සහ පරිසරය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය, 2022 රුහුණු විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව
22. දයාරත්න වී. එස්. පී., විජේවීර ඒ. ඒ., මනම්ගොඩ ඩී. එස්.,ජයසිංහ ජී. ජී. සහ විදානපතිරණ සී. යූ., (2022) " කුරුඳු වල පොත්තරළුවීමේ රෝගය හා පත්‍ර අංගමාරය සාදන ව්‍යාධිජනකයින් මර්ධනය සඳහා විකල්ප කාබනික දිලීර නාශකයක් ලෙස දේශීය ඖෂධ පැළෑටි නිස්සාරක භාවිතා කිරීම" කෘෂිකර්මය සහ පරිසරය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය 2022, රුහුණු විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව
23. හන්සිකාකේ. ඒ. එස්., කොඩිකාර කේ. ඒ. එස්., විජේවීර ඒ. ඒ., සේනානායක ජී., ජයතිස්ස එල්. පී. (2022) " ශ්‍රී ලංකාවේ අන්තර්මධ්‍ය කලාපයේ වගාකරනු ලබන කුරුඳු (*Cinnamomumverum* J. Presl*)* වල වර්ධක හා ලිංගික සෘතුඵල විද්‍යාව" ශ්‍රී ලංකා J.Natn.Sci. පදනම 2022, 50(1):87-99 DOI: http://dx.doi.org/10.4038/jnsfsr.v50i
24. විජේවීර ඒ. ඒ., හෙට්ටිආරච්චි එස්. ආර්.,හේවගේ ජේ. ඩබ්., වඩුමෙත්‍රිගේ එස්. එච්. සහ ජයසිංහ ජී. ජී (2022) "විවිධ කෘෂි පාරිසරික කලාප අතර ලංකා කුරුඳු (*Cinnamomum zeylanicum* Blume) තෙල්වල අස්වැන්න සහ ගුණාත්මකභාවය සංසන්ධනය කිරීම" 9 වැනි ජාත්‍යන්තර විද්‍යා හා තාක්ෂණ සමුළුවේ ක්‍රියාදාමයන්, රුහුණු විශ්ව විද්‍යාලය, මාතර, ශ්‍රී ලංකාව, පිටුව 72.
25. රූපසිංහ පී. ඒ. එච්. අයි., ප්‍රියදර්ශනී කේ. ඩී. එන්., සහ නිලන්ත කේ. ඒ. ආර්. (2022) "කුරුඳු තවාන් පැළ (*Cinnamomum zeylanicum* Blume) වර්ධනය සහ ජල සැපයුම් කාලාන්තරය මත සුපිරි අවශෝෂක බහු අවයවක(SAPs) බලපෑම", පළාත් පාලනය සහ නායකත්වය පිළිබඳ 1 වන ජාත්‍යන්තර සමුළුවේ ක්‍රියාදාමයන් පිටු 34-35
26. ප්‍රතිභානී එම්., රණවක ආර්. ඒ. ඒ. කේ., ජයසේකර එල්., ජයසිංහ ජී. ජී., සේනානායක ජී. සහ ගීකියනගේ එස්. (2022) " දැල්පිටිය, මැදරට පර්යේෂණ මධ්‍යස්ථානයේ වගාකරන ලද කුරුඳු ජාන එකතුවක රූප විද්‍යාත්මක ලක්ෂණ" කෘෂිකර්මය හා පරිසරය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය, පිටුව 88

2.2 අභියෝග හා ඉදිරි ඉලක්ක

2.2.1. අභියෝග

1. දෙපාර්තමේන්තුව සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයන් සීමිත වූ බැවින් ඉලක්ක ගත දෙපාර්තමේන්තු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ කටයුතු කිරිම අභියෝගයට ලක්විය.

2. අපනයන කෘෂි බෝග තාක්ෂණය ගොවි බිම් කරා රැගෙන යාම වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා කෘෂි ව්‍යාප්ති සේවාව වඩාත් ඵලදායී කාර්යයක් ඉටු කලද, දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය ක්ෂේත්‍ර නිලධාරින් සංඛ්‍යාව සහ දැනට සේවයේ නියුක්ත වන ක්ෂේත්‍ර නිලධාරින්ගේ අතර විශාල පරතරයක් පවතී. මෙම ව්‍යාප්ති නිළධාරීන් බදවා ගැනීම අත්‍යවශ්‍ය වේ.

3. දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය භෞතික පහසුකම් ප්‍රශස්ත මට්ටමෙන් සැපයීමට නොහැකියාවක් පැවති අතර නිලධාරින් සඳහා කාර්යාල පහසුකම්, උපකරණ හා භාණ්ඩ අවශ්‍යතාවයන් හා ප්‍රවාහන පහසුකම් නියමිත පරිදි සැපයීමට තරම් ප්‍රමාණවත් ප්‍රතිපාදන දෙපාර්තමේන්තුවට සතුව නොමැති වීම අභියෝගයක් විය. අහිතකර ලෙස බලපෑම් ඇතිවිය හැක.

4. ශාක ආරක්ෂණ අංශය සහ ශෂ්‍ය විද්‍යාව අංශය සඳහා ප්‍රමාණවත් තාක්ෂණික නිලධාරීන් නොමැතිවීම.

5. පසු අස්වනු රසායනාගාරයේ විද්‍යාගාර ප්‍රතීතන වැඩසටහනට අදාළ ක්‍රියාකාරකම් දිගටම කරගෙන යාමට කුසලතා සහිත ප්‍රමාණවත් සහායක කාර්ය මණ්ඩලයක් (විද්‍යාත්මක දැනුමක් සහිතව) නොමැතිවීම.

6. පාංශු හා පැළෑටි පෝෂණ අංශයේ සහ පසු අස්වනු රසායනාගාරයේ ආයතනය තුළ පර්යේෂණ නියැදි විශ්ලේෂණය සහ බාහිරව ලැබුණු නියැදි විශ්ලේෂණය සිදු කිරීම සඳහා රසායනික ද්‍රව්‍ය ප්‍රමාණවත් පරිදි නොමැතිවීම.(ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම නිසා)

7. පාංශු හා පැළෑටි පෝෂණ අංශයේ රසායනාගාර ප්‍රතීතනය අඛණ්ඩව සිදු කිරීමට ප්‍රමාණවත් යටිතල පහසුකම් නොමැතිවීම.

   උදා :රසායනාගාර කාර්ය මණ්ඩලය සඳහා ආරක්ෂිත පරිසරය.

8. භෝග - ජලය - පස සම්බන්ධතා සම්බන්ධ පර්යේෂණ සිදු කිරීමට අවශ්‍ය විද්‍යාත්මක උපකරණ නොමැතිවීම.
9. ඉන්ධන සඳහා ප්‍රතිපාදන අවම වීම හේතුවෙන් පර්යේෂණ සහ සංවර්ධන කටයුතු ප්‍රමාද වීම හා බාධා ඇතිවීම.

10. පර්යේෂණ කටයුතු සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා දැල් ගෘහ පහසුකම් සීමිත වීම.

11. අගය එකතු කිරීමේ පුහුණු වැඩසටහනක් පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සහිත ස්ථානයක් නොමැතිවීම .අගය එකතු කළ නිෂ්පාදන නිෂ්පාදනය සඳහා අවශ්‍ය සියලුම උපකරණ, වීදුරු භාණ්ඩ සහ රසායන ද්‍රව්‍ය රසායනාගාරයේ සිට පුහුණු මධ්‍යස්ථානයට ගෙන ඒමට නියමිතව ඇත.
12. රෝග ව්‍යාධි කාරක නිවැරදිව හඳුනා ගැනීම සඳහා අණුක විශ්ලේෂණය සිදු කළ යුතු නමුත් මූලික අණුක රසායනාගාර පහසුකම් නොමැතිකම නිසා අධ්‍යයනයන් සීමා වී ඇති අතර ශාක ආරක්ෂණ අංශය සඳහා සේවා බාහිරින් ලබා ගැනීම සඳහා අධික පිරිවැයක් දැරීමට සිදු වීම.
13. ක්ෂුද්‍ර ජීව විද්‍යා අධ්‍යයනයන් සඳහා අත්‍යවශ්‍ය විශේෂිත රෝපණ මාධ්‍ය මිලදී ගැනීමේ අපහසුතාව.
14. ආර්ථික අර්බුදයත් සමඟ ඇති වූ ඉන්ධන හිඟය සහ අධික ඉන්ධන පිරිවැය සමාජ ආර්ථික පර්යේෂණ අංශවලට අදාළ ක්ෂේත්‍ර සමීක්ෂණ පැවැත්වීමේ දී විශාල බාධාවක් ඇති කිරීම.

2.2.2. අනාගත ඉලක්ක / අරමුණු

- අපනයන ආදායම ඉහළ නැංවීම.

  2022 වසරේ දී අපනයන කෘෂි බෝග මෙට්‍රික් ටොන් 58, 192.95 ක් අපනයනය කිරීම මඟින් රුපියල් මිලියන 140,050.41 ක ආදායමක් ජාතික ආර්ථිකයට එක් කිරීමට හැකි වූ අතර එය පෙර වර්ෂයට වඩා ඉහළ අගයක් ගත් අතර, වසර 2025 වන විට අපනයන ආදායම රුපියල් බිලියන 150 ඉලක්කය සපුරා ගැනීමේ අරමුණ කරා යාම සඳහා, පවතින වගා වපසරිය වැඩි කිරීම, ඒකකයකින් ලබා ගත හැකි අස්වැන්න වැඩි කිරීම අපේක්ෂා කරනු ලැබේ. තවද, බෝග වගාකරුවන් , නිෂ්පාදකයින්, සැකසුම්කරුවන් හා අපනයනකරුවන් සම්බන්ධීකරණය තුලින් වැඩි විදේශ ආදායමක් ලබා ගැනීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කරන ලද අතර ඒ තුලින් අපනයන කෘෂි බෝග පාර්ශ්වකරුවන්ගේ ආදායම ශක්තිමත් කිරීමට බලාපොරොත්තු වේ.

- කුරුඳු භූගෝලීය දර්ශක සහතිකය ලබා ගැනීම.

  අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා අපනයන සංවර්ධන මණ්ඩලය ඒකාබද්ධව ශ්‍රී ලංකා කුරුඳු බෝගය සඳහා කුරුඳු භූගෝලීය දර්ශකය ලබා ගැනීමට කටයුතු කළ අතර මෙමඟින් ජාත්‍යන්තරය තුල ශ්‍රී ලාංකික කුරුඳු නිෂ්පාදනවලට අනන්‍ය සුවිශේෂී වෙළෙඳපොල අවස්ථා නිර්මාණය විම සිදු වන අතර, සත්‍ය කුරුඳු නිපදවන ලෝකයේ එකම රට වශයෙන් ජාත්‍යන්තර වෙළෙඳපොළ තුල ශ්‍රී ලංකාවට හිමිවිය යුතු ස්ථානය සුරක්ෂිත කිරීමටත්, සුරක්ෂිත වෙළෙඳපොල තුලින් ඉහළ විදේශ විනිමයක් ලබා ගැනීමටත් බලාපොරොත්තු වන අතර මේ සඳහා දිස්ත්‍රික් මට්ටමින් දෙපාර්තමේන්තු නිළධාරීන් හා ගොවීන් අරමුණු කරගෙන

කිරීමේ පුහුණු වැඩසටහන් පවත්වන ලද අතර 2023 වසරේ ජර්මනියේදී පැවැත්වීමට නියමිත අන්තර්ජාතික කුළුබඩු ප්‍රදර්ශනය සඳහා කුරුඳු භූගෝලීය දර්ශක සහතිකය ලබා ගත් කුරුඳු ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ.

- කාබනික භෝග වගාව ප්‍රචලිත කිරීම.

  රජය විසින් රසායනික පොහොර භාවිතය අවම කිරීම හා කාබනික පොහොර නිෂ්පාදනය කිරීම දිරි ගැන්වීම සඳහා ගනු ලැබූ තීරණය හේතුවෙන් වෙලෙදපොළ තුල රසායනික පොහොර හිඟතාවය නිසා කාබනික වගාවන් කෙරෙහි ගොවීන් වඩාත් නැඹුරු විය. තවද, කාබනික නිෂ්පාදන සඳහා වෙළෙඳපල පවතින ඉහළ මිල ගණන් හේතුවෙන් කාබනික බෝග නිෂ්පාදන ඉහළ නැංවීම හරහා ආර්ථිකව වාසි අත්කර ගැනීම අරමුණු කරගනිමින් කාබනික අපනයන කෘෂි බෝග වගා වපසරිය ඉහළ නැංවීම සඳහා වැඩි අවධානය යොමු කර ඇත. එහිදී දෙපාර්තමේන්තුව මඟින් කාබනික වගාව ප්‍රචලිත කිරීම හා දිරිගැන්වීමට අවශ්‍ය ව්‍යාප්ත වැඩසටහන් සඳහා ප්‍රතිපාදන ලැබීම අනිවාර්ය අවශ්‍යතාවයක් වේ.

- යහපත් නිෂ්පාදන පිළිවෙත් Good Manufacturing Practices (GMP) සහතිකකරණ ක්‍රියාවලිය , යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) වැඩසටහන සහ අපනයන කෘෂිබෝග පිරිසැකසුම් මධ්‍යස්ථාන ක්‍රියාත්මක කිරීම, ආර්ථිකව වැඩි විදේශ විනිමයක් ඉපයීම සඳහා අපනයන කෘෂිබෝග නිෂ්පාදනයන් , අගය එකතුකළ නිෂ්පාදන ලෙස දේශීය හා විදේශීය වෙළඳපලට ඉදිරිපත් කිරීම මඟින් වැඩි ආදායමක් ලබා ගැනීමට පවතින හැකියාව සැලකිල්ලට ගැනීම අත්‍යවශ්‍ය වේ. යහපත් කෘෂි කාර්මික හා නිෂ්පාදන පිළිවෙත් ක්ෂේත්‍රයේ නිරත වගාකරුවන් හා නිෂ්පාදන කරුවන් අතර ප්‍රචලිත කරවීමට සැලසුම් කර ඇත. ඒ යටතේ උනන්දුව සහිත නිෂ්පාදකයන් ආකර්ෂණය කර ගැනීම හා නවීන තාක්ෂණයෙන් යුතු යන්ත්‍ර සූත්‍ර උපකරණ හා මෙවලම් හඳුන්වා දීම හා නියාමනය සඳහා දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම සිදු කිරීමට කටයුතු කරනු ඇත. මේ යටතේ වැඩි අපනයන කෘෂි බෝග නිෂ්පාදන ප්‍රමාණයක් විදේශ වෙළෙඳපලට ඉදිරිපත් කරමින් වැඩි විදේශ ආදායමක් ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.

- 2022 වර්ෂයේදී පැවැති කොරෝනා, ආර්ථික අර්බුද මෙන්ම බලශක්ති අර්බුදයන් හමුවේ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. දෙපාර්තමේන්තුව මඟින් වෙබ් අඩවිය, Face book , Zoom වැනි අන්තර්ජාල පහසුකම් මෙන්ම රූපවාහිනී සහ ගුවන්විදුලි වැඩසටහන් හා දුරකථන මාර්ගයෙන් දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් අපනයන කෘෂි බෝග වගාවන් පිළිබඳ අවශ්‍ය තාක්ෂණික උපදෙස් හා මග පෙන්වීම් සිදු කරන ලදී.
- අලුතින් හඳුන්වා දුන් කුරුඳු වර්ග තවාන් පැල නිෂ්පාදනය වැඩි කිරීම.
- අලුතින් හඳුන්වා දුන් කුරුඳු ප්‍රභේදවල මව් උද්‍යාන සඳහා බෝග කළමනාකරණ පිළිවෙත්(package) සංවර්ධනය කිරීම.

- නව කුරුදු වර්ග නිකුත් කිරීම.
- රසායනික පහංවන පළිබෝධ සහ රෝග පාලනය මුම හඳුන්වා දීම.
- කුරුදු යඳහා ඒකාබද්ධ වල් කළමනාකරණ පිළිවෙත්(package) සඳුනා ගැනීම.
- කුරුදු වගාවන්ට පෘෂ්ඨවංශික පළිබෝධ හානි සෘජුවේරු කිරීම.
- ගවේෂක සහ ප්‍රතිඵලදායිකාරක කරුණු සමඟ නව කුරුදු ඉඩම එකතු කළ නිෂ්පාදන සංවර්ධනය කිරීම.
- ගකාමීකරණ විශ්ලේෂණ පරාමිතීන් සමඟ පස සහ ගස පෙෂණ ආශ්‍රයේ පිළිගත් විෂය පථය ස්ථාපිත කිරීම.
- ආර්ථික පරීක්ෂණ ඒකකය මඟින් සිදු කරනු ලබන කාර්යයන් විතිවිලිකරණය කිරීම .
  ගොවිපල මිල ඵනකු කිරීම, බෝග දත්ත රැස් කිරීම හා මෙහෙ කිරීම් ඝනාංදිය එයට ඇතුළත් වේ. දිවයින පුරා ගොවිපල මිල ඵනකු කිරීම් සඳහා මාර්ගගත දත්ත පදනමක් නිර්මාණය කිරීමට මුල පිරීමත් ඵලස ඝාකච්ඡා හා සැලසුම් දැනට්මප් සකස් කර අවසන් ව ඇත.
- අවභාවන ඇති බෝග වලට දරාළ තක්සෝනික ගබාජ ආර්ථික හැවළ සඳුනා ගැනීම සහ පිළියම් ගොයා ගැනීම් සඳහා පරීක්ෂණ සැලසුම් කිරීම සහ සැලැස්ම් නිර්මාණය කිරීම
- කුරුදු, ගම්මිරිස්, සාරවු නැවි, ඝාදිස්ස ඇතුළු ප්‍රධාන ඵපනයන කෘෂිකාර්මික බෝග යඳහා කිසි තක්ෂ ප්‍රතිරක්ෂාවය නිර්මාණ යාන්ත්‍රණයක් සඳුනාගෙන ස්ථාවින කිරීම.

.....

ඒ.ඒ.පී. දිස්නා

පධානාක්ෂ ජනරාල්

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.

ඒ.ඒ.පී. දිස්නා
අධ්‍යක්ෂ ජනරාල්
අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
IBS ළඟිලිංගම් බණ්ඩාරනායක මාවත
පේරාදෙණිය

පරිච්ඡේදය 03

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

2022-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒ.සී.ඒ -එෆ්

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය 2022		සටහන	තත්‍ය 2022	2021	
-	ආදායම් ලැබීම්				
-	ආදායම් බදු	1			
-	**දේශීය භාණ්ඩ හා සේවාමත බදු**	2			ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මතබදු	3			
-	**බදු නොවන ආදායම් හාවෙනත්**	4			
-	මුළු ආදායම් ලැබීම් (අ)				
-	ආදායම් නොවන ලැබීම්				
2,354,249,860	භාණ්ඩාගාර අග්‍රිම		1,633,160,000	1,179,550,000	ඒසිඒ-3
	තැන්පතු		86,978,491	4,864,487	ඒසිඒ-4
35,000,000	අත්තිකාරම් ගිණුම්		40,885,228	43,042,029	ඒසිඒ-5/5(ඒ)
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්				
2,389,249,860	මුළු ආදායම් නොවනලැබීම් (ආ)		1,761,023,719	1,227,456,516	
2,394,249,860	**මුළු ආදායම් ලැබීම්සහ ආදායම් නොවන ලැබීම්** ඇ = (අ)+(ආ)		1,761,023,719	1,227,456,516	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		119	1,927	
2,394,249,860	ශුද්ධ ආදායම් ලැබීම් **සහ ආදායම් නොවන** ලැබීම්ඉ=(අ)+(ආ)		1,761,023,600	1,227,454,589	
	අඩුකළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
716,000,000	වැටුප්, **වේතනසහ අනෙකුත් සේවක ප්‍රතිලාභ**	5	696,666,692	629,847,910	
88,000,000	**අනෙකුත් භාණ්ඩ හා සේවා**	6	59,250,320	71,209,393	ඒසිඒ-2(ii)
17,000,000	**සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්**	7	14,924,175	9,901,734	
	පොළී ගෙවීම්	8			
	වෙනත් පුනරාවර්තනවියදම්	9			
821,000,000	මුළු පුනරාවර්තනවියදම් (ඊ)		770,841,187	710,959,037	
	මූලධන වියදම්				
20,500,000	මූලධන වත්කම් **පුනරුත්ථාපනය හාවැඩිදියුණු** කිරීම්	10	14,455,901	12,590,281	
	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11		11,625,392	
250,000,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	240,853,621	360,697,382	ඒසිඒ-2(ii)
	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13			
1,500,000	හැකියා වර්ධනය	14	789,075	409,325	
9,000,000	වෙනත් මූලධන වියදම්	15	8,221,318	13,108,232	
281,000,000	මුළු මූලධන වියදම් (උ)		264,319,915	398,430,612	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)				
	තැන්පතු ගෙවීම් 14		2,555,937	3,303,161	ඒසිඒ-4
40,000,000	අත්තිකාරම් ගෙවීම් 15 වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම		43,604,499	51,433,938	ඒසිඒ-5/5(ඒ)
40,000,000	ප්‍රධාන ලෙජර් වියදම් (උ)		46,160,436	547,737,100	
1,142,000,000	මුළු වියදම් එ= (ඊ+උ+ඌ)		1,081,321,538	1,164,126,748	
	...2022..දෙසැම්බර් 31 දිනට ශේෂය= (ඉ-එ)		679,702,062	63,327,841	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය			63,327,841	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය			63,327,841	ඒසිඒ-3

3.2 .මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය.

ඒසිඒ-පී

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	නත්‍ය 2022 රු.	2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	1,107,015,274	1,110,288,684
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	130,201,196	127,481,925
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**1,237,216,470**	**1,237,770,609**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		43,573,120	125,276,403
දේපළ පිරියත හා උපකරණ සංචිතය		1,107,015,274	1,110,288,684
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ජංගම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒසිඒ-4	86,628,076	2,205,522
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	
මුළු වගකීම්		**1,237,216,470**	**1,237,770,609**

පිටු අංක...07....සිට ...51... දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ඡායාරූ පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් නොරතුරු සහ ඇමුණුම් පිටු අංක ...52.... සිට ...72.... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් නොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරනු බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	~~ප්‍රධාන මූල්‍ය නිලධාරි~~/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ ~~කොමිසාරිස් (මුදල්)~~
තනතුර :	තනතුර :	නම :
දිනය : 2023.02.27	දිනය : 2023/02/24	දිනය : 2023/02/23
	ඒ.පී.පී. දිසානායක අධ්‍යක්ෂ ජනරාල් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව 1095 සිරිමාවෝ බණ්ඩාරනායක මාවත පේරාදෙණිය	එම්.එස්.එස්.එල්. පීරිස් ප්‍රධාන ගණකාධිකාරි අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව 1095, ගැට්ටේ පේරාදෙණිය

3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

.....2022-12-31..... දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	කක්‍ය	
	2022	**2021**
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්		1,887,618
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	87,252,987	42,968,775
අග්‍රිම ලැබීම	1,633,160,000	1,179,550,000
අත්තිකාරම් අයකර ගැනීම	42,257,699	1,103,318
තැන්පතු ලැබීම්	86,978,491	3,719,304
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**1,849,649,177**	**1,229,229,014**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	1,026,338,882	540,722,052
සහනාධාර සහ මාරුකිරීම්	5,770,416	6,896,502
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරණ ලද වියදම්	771,379,325	623,471,903
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	119	1,927
අත්තිකාරම් ගෙවීම්	43,604,499	46,705,708
තැන්පතු ගෙවීම්	2,555,937	3,305,186
මෙහෙයුම්ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**1,849,649,178**	**1,221,103,278**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**(1)**	**8,125,737**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී		
ලාභාංශ		
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම		
උපණය අයකර ගැනීම්		
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)		
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කරගැනීම්		8,125,737
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)		8,125,737
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)		(8,125,737)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල්ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)		**(0)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්		
විදේශීය ණය ගැනීම්		
ප්‍රදානයන් ලැබීම්		
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)		
අඩුකළා : මුදල් වැය කිරීම්		
රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් ගෙවීම්		
තැන්පත් ගිණුම් ගෙවීම්		
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)		
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)		
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)		**(0)**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය		
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය		

3.4. මුල්‍ය ප්‍රකාශ සටහන්

3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු, 000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව (රුපියල් මිලියන)	අවසන් ඇස්තමේන්තුව (රුපියල් මිලියන)	ප්‍රමාණය (රු.) (මිලියන)	අවසාන ආදායම් ඇස්තමේන් තුවේ % ලෙස
2002-01-01	රජයේ ගොඩනැඟිලි කුලී	2800	2800	2681	95.75
2002-02-99	ණය පොලිය - අනෙකුත්	5500	5500	5172	94.03
2003-01-00	විකුණුම් සහ ගාස්තු - දෙපාර්තමේන්තු විකිණීම්	22000	22000	43263	196.65
2003-02-99	විකුණුම් හා ගාස්තු- පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම් - විවිධ	1000	1000	760	76
2003-99-00	විකුණුම් හා ගාස්තු- අනෙකුත් ලැබීම්	5000	5000	4910	98.20
2006-02-02	ප්‍රාග්ධන වත්කම් විකිණීම - වෙනත්	100	100	177	177

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු, 000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගනු ලැබූ ප්‍රතිපාදන
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස
පුනරාවර්තන	821,000	821,000	770,841	93.89
ප්‍රාග්ධන	281,000	281,000	264,319	94.06
එකතුව	1,102,000	1,102,000	1,035,161	93.93

3.7. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු, 000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01.	වැවිලි අමාත්‍යාංශය	135-2-3-48-2509	918,350	918,350	655,467	71.37
		135-2-15-2-2507	73,031	73,031	69,811	95.59

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2022දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2022දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැඟිලි හා ව්‍යුහයන්	439,548	439,548		100
9152	යන්ත්‍රෝපකරණ	317,742	317,742		100
9153	ඉඩම්	349,723	349,723		100
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

3.9. විගණකාධිපති වාර්තාව.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. සිපිසිජී/කේඩී/එෆ්/ඩීරීඒ/සී/2023/07

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023 මැයි 24 දින

ගණන්දීමේ නිලධාරී,
අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.

ශීර්ෂය-289 අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය-289 අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමණාකරණ විගණන වාර්තාව 2023 මැයි 24 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ,මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

අංක 306/72, පොළුදුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගනය කරණු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරනු ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාර විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මහහැරීමෙන් ,වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් තොනික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 පුනරාවර්තන වියදම්

(අ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වල සහනාධාර සහ මාරු කිරීම් වියදම් එකතුව රු.9,153,759 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වල පුද්ගල පඩිනාඩි සහ මෙහෙයුම් වියදම් එකතුව රු. 6,101,954 ක් වැඩියෙන් දක්වා තිබුණි.

1.6.2 අත්තිකාරම් ගෙවීම්

රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් " බී" ගිණුමේ විශ්‍රාම ගිය හා සේවය අවසන් කර තිබුණු නිලධාරීන් 09 දෙනෙකුගෙන් වසර 01 ත් 03 ත් අතර කාල පරාසයක සිට එකතුව රු.559,607ක ණය ශේෂයක් අය කරගෙන නොතිබුණි.

1.6.3 මූල්‍ය නොවන වත්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට දෙපාර්තමේන්තුව සතු අක්කර 112.24 (හෙක්ටයාර 44.8943) ක ඉඩම් 18 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට දෙපාර්තමේන්තුවට අයත් වර්ග අඩි 70,320 ක ගොඩනැගිලි 49 ක වටිනාකම හඳුනාගෙන මූල්‍ය නොවන වත්කම් (ඒසීඑ-06 සහ එස්ඒ 82) යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල මිලදී ගෙන තිබුණු රු. 8,206,747 ක මූල්‍ය නොවන වත්කම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ගිණුම්ගත කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1. නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

නීති.රීති හා රෙගුලාසිවලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම
(අ) පාර්ලිමේන්තු පනත්		
2003 අංක 22 දරන බීජ පනතේ 08 (1) වගන්තිය	-	2017 වසරේ සිට සමාලෝචිත වර්ෂය අවසන් දින දක්වා කාලය තුල නිල්ලඹ උප පර්යේෂණ මධ්‍යස්ථානය පැළ නිෂ්පාදනය කර ඇතත් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා යටතේ ලියාපදිංචි කර නොතිබුණි.
(ආ) චක්‍රලේඛ		
2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය	1,130,095	අත්‍යවශ්‍ය සේවාවන් නොවන ප්‍රමුඛතාවයන් ලබා දිය නොහැකි දෙපාර්තමේන්තුවේ කාර්යාලය තුල හා නිලධාරීන්ගේ පහසුකම් සඳහා අවස්ථා 09 කදී මුදල් වැය කර තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 කාර්යයභාර්යන් ඉටු නොකිරීම

මහනුවර දිස්ත්‍රික් කාර්යාලය පිහිටි ඉඩම මහවැලි ගඟට මායිමව පිහිටා ඇති අතර ගං ඉවුර දැඩිව බාදනය වීම හේතුවෙන් ගඟ දෙසට ඉදිකර ඇති බැම්ම, රැස්වීම් ශාලාව, තාප්පය සහ ඉන්ටර්ලොක් ගල් අතුරා ඇති මිදුලද පුපුරා ඉරිතලා නාය යාමේ ඉහළ අවදානමක් පැවතියද ජීවිත හා දේපල ආරක්ෂා කරගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම

අපනයන කෘෂිහෝග නිෂ්පාදන ගොවිපළ, ගොවීන්, සැකසුම්කරුවන් සහ වෙළෙන්දන් ලියාපදිංචි කිරීම සහ ශ්‍රී ලංකාවේ ගම්මිරිස් සහ කුරුඳු සඳහා භූගෝලීය දර්ශක (GI) ලබා ගැනීමට අදාල ක්‍රියාකාරකම් සිදුකිරීමේ අරමුණින් 2020 අගෝස්තු 27 දින වන විට රු.10,647,000 ක් වැයකර ටැබ්ලට් පරිගනක 300 ක් මිලදීගෙන ආයතනගත හා ක්ෂේත්‍රගත නිලධාරීන් 300 දෙනෙකුට ලබා දී රු. 1,505,000 ක් වැයකර පරිගණක මෘදුකාංගයක්ද සංවර්ධනය කර හඳුන්වා දී තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය අවසන් දින වන විට ටැබ්ලට් පරිගණක ලබාගත් 58 දෙනෙකු අදාල මෘදුකාංගය භාගත කරගෙන නොතිබුණි. එසේම අදාල පරිසනක භාවිතා කර පසුගිය වර්ෂ 02 ක කාලය තුල සමස්ථ කුරුඳු ගොවීන් 250,000 කගෙන් 238 දෙනෙක් (සියයට 0.09) තරම් ඉතා අඩු ප්‍රමාණයක් ලියාපදිංචි කරගෙන තිබුණි.එම ප්‍රමාණය ලියාපදිංචි කිරීමද ටැබ් පරිසනක 29 කින් පමණක් සිදු කර ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය. එසේම අදාල මෘදුකාංගය භාවිතා කර එම කාලය තුල අපනයන කෘෂි භෝග නිෂ්පාදන ගොවිපල සැකසුම්කරුවන් හා වෙළඳුන් ලියාපදිංචි කිරීම කෙරෙහිද අවධානය යොමුකර නොතිබුණි. එමෙන්ම මෙසේ රු. 1,505,000 ක් වැයකර මෘදුකාංගයක් හඳුන්වා දී ඒ සඳහා වාර්ෂිකව රු. 135,000 ක් බැගින් නඩත්තු වියදම් ගෙවිය යුතුව තිබුනද, ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා මෘදුකාංගය භාවිතා කර නොමැති බව කරන ලද විගණනයේදී නිරීක්ෂණය විය.ඒ අනුව රු. 12,152,000 ක් වැය කර ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබුණු ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.1.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

(අ) කුණ්ඩසාලේ උප පර්යේෂණ මධ්‍යස්ථානයේ විසිරි ජල සම්පාදන පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂයන් හීදි රු. 399,599ක් වැයකර ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට අදාල ජල සම්පාදන පද්ධතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) නාරම්මල උප පර්යේෂණ මධ්‍යස්ථානයේ විද්‍යාගාරයට සම්බන්ධ නව දෙමහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා 2018 වර්ෂයේදී රු.29,200,000 ක ඇස්තමේන්තුවක් සකස් කර ඉදිකිරීම් ආරම්භ කර තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් නිම කර තිබුණේ රු. 8,084,500 ක වැඩ පමණි. බිත්ති කපරාරු කිරීම වැනි වැඩ නිම කර නොතිබුණු බැවින් ගොඩනැගිල්ල ඌන උපයෝජිතව පැවතුණි.

3.2 වක්කම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුවේ පර්යේෂණ මධ්‍යස්ථාන 03 ක තිබෙන අක්කර 17.3 ක ඉඩම් කිසිදු ඵලදායී ආර්ථික කටයුත්තකට යොදා නොගෙන නිෂ්කාර්යයව පැවතුණි.

(ආ) දෙපාර්තමේන්තුව පරිහරණය කරන වෙනත් රජයේ ආයතන හා පුද්ගලික අංශයට අයත් එකතුව අක්කර 390 ක ඉඩම් කොටස් 31 ක් පවරා ගැනීම් කටයුතු අවසන් වී නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුව භාවිතා කරන වෙනත් අමාත්‍යාංශවලට අයත් වාහන 34 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) වල්පිට පටක රෝපණ මධ්‍යස්ථානයේ රු. 244,375 ක් වැයකර ඉදිකර තිබුණ විසුරුම් ජල පද්ධතිය වර්ෂ 03 ක කාලයක සිට නිෂ්කාර්යයව පැවතුණි.

4. මානව සම්පත් කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට අනුමත කාර්යය මණ්ඩලය, තථ්‍ය කාර්යය මණ්ඩලය සමඟ සැසඳීමේදී තනතුරු 339 ක පුරප්පාඩු පැවතුණි. ඒ අතරින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ පැවති පුරප්පාඩු 24 න් 23 ක්ම ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයට අයත් සහකාර අධ්‍යක්ෂ තනතුරු වූ අතර එය දෙපාර්තමේන්තුවේ කටයුතු සම්බන්ධයෙන් අහිතකර ලෙස බලපා තිබුණි. දිස්ත්‍රික් / විෂයානුබද්ධ ව්‍යාපෘති නිලධාරි තනතුරෙහි පුරප්පාඩු 170 ක් පැවති අතර එය ක්ෂේත්‍ර කටයුතු මනාලෙස පවත්වාගෙන යාමට බාධාවක්ව පැවති අතර පර්යේෂණ හා සංවර්ධන සහකාර තනතුරු 84 ක් අනුමත කර තිබුණු නමුත් එම තනතුර සඳහා කිසිදු නිලධාරියෙකු බඳවාගෙන ද නොතිබුණි. එසේම ගොවිපල කළමණාකරු තනතුරු 21 න් 11 ක් පුරප්පාඩුව පැවතුණි.

එච්.ඒ. ආනන්ද
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පරිච්ඡේදය 04

කාර්ය සාධන දර්ශක

4.1.ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

4.1.1. අපනයන කෘෂි බෝග සංවර්ධන වැඩසටහන

අපනයන කෘෂිකර්ම ක්ෂේත්‍රය හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීම මඟින් දේශීය ආර්ථිකය නංවාලීම හා ඒ තුලින් වැඩි විදේශ විනිමයක් උපයා ගැනීමේ අරමුණින් යුතුව 2022 වසරේදී , අපනයන කෘෂි බෝග සංවර්ධන වැඩසටහන යටතේ මහා භාණ්ඩාගාරය මඟින් ලබා දුන් රු.මි. රු.මි.250.00 ක ප්‍රතිපාදන වලින් රු.මි. 240.85 ක් සංවර්ධන වැඩසටහන් සඳහා වැය විය.

වැඩසටහන	වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.)	ඉලක්ක
වගා වපසරිය ඉහල නැංවීමේ වැඩසටහන	43.24	• හෙක්ටයාර - 365 • කුඩා පරිමාණ ගෙවතු පැළ -176,762 • ගෙවතු සඳහා පැළ -86,530 • පොකුරු ගම්මාන වැඩසටහන යටතේ පැළ -152,000 • කහ සහ ඉඟුරු ආයෝජන ආධාර වැඩසටහන - හෙක්ටයාර - 60 • පුවක් වගාව - පුවක් පැළ 180,000
මධ්‍යම පැළ තවාන් සංවර්ධනය	26.50	• පුවක් බීජ - 40,000 • සාදික්කා බීජ - 3,000 • පොලි බෑග් සහ අනෙකුත් යෙදවුම් • බඳුන් මාධ්‍ය මිලදී ගැනීම් • ජල සම්පාදන පද්ධති සහ මවු ශාක උද්‍යාන පිහිටුවීම
අපනයන කෘෂිභෝග ඵලදායිතාව ඉහල නැංවීමේ වැඩසටහන	37.17	• පාළු පැළ ලබාදීම- හෙක්ටයාර - 890 • සත්ත්ව හානි වැලැක්වීම - ඒකක 25 • ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති - ඒකක 10 • අගය එකතු කිරීමේ වැඩසටහන
අගය එකතු කිරීමේ වැඩසටහන	34.00	• හෙක්ටයාර - 15 • පසු අස්වනු නාක්ෂණික උපකරණ - 400 • වෙළඳ ප්‍රවර්ධන වැඩසටහන් - 10 • ගොවි සායන - 50 • කුළුබඩු උද්‍යාන හා ආදර්ශන- 10 • මෘදුකාංග යෙදවුම්-1 • මෘදුකාංග සංවර්ධනය - 10 • කාබනික සහනික - 10 • GMP / GAP / ISO / BRC - 15
ජනමාධ්‍ය සහ සන්නිවේදනය	20.00	• ඉලෙක්ට්‍රොනික් මාධ්‍ය - 100 • මුද්‍රිත මාධ්‍ය -50 • අත්පත්‍රිකා, පෝස්ටර් - 200,000 • ප්‍රදර්ශන -04 • තොරතුරු සන්නිවේදනය 10,000
කුසලතා සංවර්ධනය	1.65	• ගොවි පුහුණු 1,000 • ක්ෂේත්‍ර දින 150 • නිලධාරී පුහුණු 22 • වැඩමුළු සම්මන්ත්‍රණ 11 • පුහුණු, මාතර කුරුඳු පර්යේෂණ මධ්‍යස්ථානය - 50
පරිපාලන වියදම්	6.07	
2021 වසරේ අතැනි බිල්පත් ගෙවීම්	81.37	
මුළු ප්‍රතිපාදන ප්‍රමාණය	250.00	

2022 වසරේදී රට තුල පැවැති බලශක්ති සහ ආර්ථික අර්බුද හමුවේ නව වගා සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, අපනයන කෘෂි බෝගයන්හි වගා වපසරිය වැඩි කිරීමේ අරමුණින් යුතුව ක්‍රියාත්මක කරනු ලැබූ නව වගා සංවර්ධන වැඩසටහන යටතේ කුරුඳු, ගම්මිරිස්, සාදික්කා, කරාඹු, කොකෝවා, කෝපි,කරඳමුංගු, යන අපනයන කෘෂි බෝග වගා හෙක්ටයාර 272.11 ක වගා වපසරියක් වගා කිරීමට හැකි විය.

ගෘහස්ථ පරිභෝජනය සඳහා අවශ්‍ය කුළුබඩු ගෙවත්ත තුළින්ම නිෂ්පාදනය කර ගැනීම, ගෙවත්ත තුල කුඩා පරිමාණ ආර්ථික වගාවක් ඇති කිරීම, මහා පරිමාණයෙන් වගා නොකෙරෙන අපනයන කෘෂිබෝග පොකුරු ගම්මාන ලෙස වගා කිරීම, ඉඩමේ ඵලදායිතාවය වැඩි කිරීම සහ අපනයන කෘෂිබෝග කුඩා පරිමාණ ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

ඉඩම් අක්කර 0.25 ට අඩු කුඩා ගෙවත්තකින් උපරිම ආර්ථික ප්‍රතිලාභ ලැබෙන මට්ටමට පත් කිරීම අරමුණු කර ගත් කුඩා ගෙවතු වැඩසටහන හා සෞභාග්‍යා ගෙවතු වැඩසටහන සඳහා පැළ ලබා දුන් අතර කුඩා ගෙවතු වැඩසටහන යටතේ පැළ 84,901 ක් ද සෞභාග්‍යා ගෙවතු වගා වැඩසටහන යටතේ පැළ 27,820 ක් නොමිලයේ ලබා දෙන ලදී.

පොකුරු ගම්මාන වැඩසටහන යටතේ එක් ගම්මානයක් හෝ ගම්මාන කිහිපයක් ඒකාබද්ධ කොට “පොකුරු ගම්මාන” වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර එක් පොකුරු ගම්මානයකට අවම වශයෙන් සාමාජිකයින් 25 ක්වත් සිටින සේ පොකුරු ගම්මාන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙහිදී, කණ්ඩායමක් ලෙස සංවිධානය කර පැළ නිකුත් කිරීමේ සිට අස්වනු අලෙවිකරන අවස්ථාව දක්වා ක්‍රමවත් සැලැස්මක් සකස්කර ගොවීන් සවිබල ගැන්වීමට සහ වෙළඳපල සම්බන්ධීකරණයට කටයුතු කරනු ලැබීය. මේ යටතේ වැනිලා, කරඳමුංගු හා සාදික්කා පැළ 41,456ක් පැළ ලබා දෙන ලදී.

ගෙවතු වගා සඳහා කහ පැළ ලබාදීමේ වැඩසටහනක් ද දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාවට නංවන ලද අතර, ගෘහස්ථ පරිභෝජනය සඳහා අවශ්‍ය කහ සහ ඉඟුරු අවශ්‍යතාවය තම ගෙවත්ත තුලින් නිෂ්පාදනය කිරීම අරමුණු කර ගන්නා ලදී. මේ යටතේ හෙක්ටයාර 20.7 වගා වපසරියක් තුල කහ සහ ඉඟුරු වගාවන් ස්ථාපිත කරන ලදි.

2022 වසර තුලදී ද පුවක් වගා වැඩසටහන දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කරන ලද අතර , පරිසර සංරක්ෂණය කිරීම අරමුණු කරන ලදී. මෙම පුවක් වගා ප්‍රවර්ධන වැඩසටහන යටතේ පුවක් පැළ 183,859 ක ප්‍රමාණයක් ගෙවතු . රාජ්‍ය , පුද්ගලික ආයතන හා වතු සමාගම් වෙත බෙදා දෙන ලදී.

උසස් ගුණාත්මයෙන් යුතු රෝපණ ද්‍රව්‍ය වගාකරුවන් වෙත සැපයීම අරමුණු කොට ගත් පැළ නිෂ්පාදන වැඩසටහන ද මෙම වැඩසටහන්වලට සමගාමීව ක්‍රියාත්මක කරන ලදි. දෙපාර්තමේන්තු වැඩසටහන් සඳහා අවශ්‍ය වාර්ෂික පැළ ප්‍රමාණයන් දෙපාර්තමේන්තුව මඟින් සෘජුවම පවත්වා ගෙන යන පැළ තවාන් 12ක් මඟින් හා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි පෞද්ගලික පැළ තවාන් මඟින් ලබා ගනී. යටිතල පහසුකම් අවශ්‍යතා සැපිරීම, රෝපණ ද්‍රව්‍ය හා රෝපණ මාධ්‍යය සැපයීම මෙන්ම වාර්ෂික පැළ අවශ්‍යතාවයන් සපුරාලීමට කටයුතු කරන අතර, පෞද්ගලික පැළ තවාන් 755 ක් වෙත අවශ්‍යවන්නාවූ මහ පෙන්වීම පැළ නිෂ්පාදන වැඩසටහන යටතේ ක්‍රියාවට නංවන ලදි. 2022 වර්ෂය තුළ දෙපාර්තමේන්තු පැළ තවාන් වල පැළ නිෂ්පාදනය පැළ මිලියන 17.58 ක් විය.

අපනයන කෘෂි බෝග වගාවන්ගෙන් උපරිම ඵලදාවක් ලබා ගැනීම සඳහා පවතින වගාවන්ගේ ඵලදායීතාවය ඉහළ නැංවීම අත්‍යාවශ්‍ය වේ. මෙම වැඩසටහන තුලින් වගා ඒකක භූමි ප්‍රමාණයකින් ලබා ගන්නා අස්වනු ප්‍රමාණය ඉහළ නැංවීමට බලාපෙරොත්තු වේ. ඒ අනුව 2022 වසරේදී ඵලදායීතාවය ඉහළ නැංවීමේ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාවට නංවන ලද අතර, වගාව තුල පාළු සිටුවීමට අවශ්‍ය පැළ ලබා දෙන ලදි. ඒ අනුව පාළු පැළ සිටුවීමේ වැඩසටහන යටතේ හෙක්ටයාර 828.85 ක වගාව ප්‍රතිස්ථාපනය කරන ලදි.

නිරන්තරයෙන් වගාවන්ට සිදුවන කාලගුණික වෙනස්කම් වලින් භෝගයන්ට වන හානිය වළකාලීම සඳහා හා වන සතුන්ගෙන් වගාවන්ට සිදුවන්නා වූ හානි වලින් වගාවන් ආරක්ෂා කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් 50% ක පිරිවැය දරමින් ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති ඒකක 02 ක් වගා කරුවන් වෙත සපයන ලදි. තවද, බෝග වගාවන් වන සතුන්ගෙන් හානි වීම වලක්වා ලිම සඳහා 50% ක පිරිවැය දෙපාර්තමේන්තුව විසින් දරමින් ආරක්ෂිත වැටවල් 12ක් ඉදි කරන ලදී.

දේශීය මෙන්ම විදේශීයවද ශ්‍රී ලාංකීය කුළුබඩු අනන්‍ය වූ පිළිගැනීම හේතුවෙන් එය වාසිදායක ලෙස භාවිතා කිරීමේ උපාය මාර්ගයක් ලෙසත් දැනට අළුතින් ජනිත වී ඇති වෙළඳපල අවස්ථාවන් උපරිමව භාවිතා කිරීම අත්‍යාවශ්‍ය වේ. ඒ මඟින් අපනයන පරිමාව ඉහළ නැංවීමත් ආදායම ඉහළ නැංවීම සඳහා උපාය මාර්ගයක් ලෙස අගය එකතු කිරීම හඳුනාගත් අතර ඒ යටතේ ඉහළ ගුණාත්මක භාවයෙන් යුතු නිෂ්පාදන වෙළඳපොලට හඳුන්වාදීම , ඒ සඳහා අන්තර්ජාතික පිලිගැනිමකින් යුත් තත්ත්ව සහතික ලබාදීම හා සහතිකරණය යටතේ වූ කාබනික වගා ස්ථාපනය කිරීම සිදුකරන ලදි. පිරිසැකසුම් මධ්‍යස්ථාන හා පසු අස්වනු තාක්ෂණය ඉහළ ගුණාත්මක මට්ටමකින් තබා ගැනීම සඳහා යන්ත්‍ර සූත්‍ර ලබා දීම සිදු කරන ලදි.

පසුඅස්වනු තාක්ෂණ ආයෝජන ආධාර ක්‍රමය යටතේ කුඩා හා මධ්‍ය පරිමාණ කුරුඳු පිරිසැකසුම් මධ්‍යස්ථාන 42 ක් , අනෙකුත්පිරිසැකසුම් මධ්‍යස්ථාන 03 සහ කේන්ද්‍රී පිරිසැකසුම් මධ්‍යස්ථාන 04 ක් සඳහා ආයෝජන ආධාර ලබාදෙන ලදි. පසු අස්වනු තාක්ෂණය යාන්ත්‍රිකරණය තුළින් අස්වනු වල ඉහළ ගුණාත්මකභාවයක් ලබාගැනීම හා මිනිස් ශ්‍රමය අවම ලෙස භාවිතය තුළින් නිෂ්පාදන වියදම අඩුකිරීම සඳහා හා යන්ත්‍රෝපකරණ 97 ක් හා කුරුඳු තෙල් නිස්සාරණ ඒකක 13 ක් සඳහා ආධාර ලබාදෙන ලදි.

උපකරණ වර්ගය	සංඛ්‍යාව
වියලන යන්ත්‍ර	30
ගම්මිරිස් බීජ වෙන් කරන යන්ත්‍ර	19
ගම්මිරිස් උණු වතුර ප්‍රතිකාර කට්ටල	02
ගම්මිරිස් ගල් වැලි ඉවත් කිරීමේ යන්ත්‍රය	01
කුළුබඩු ඇඹරීමේ යන්ත්‍ර	06
කෝපි පල්පරය	01
කෝපි පොතු ගැලවීමේ යන්ත්‍රය	01
කෝපි බැදීමේ යන්ත්‍ර	02
කහ තැම්බීමේ ඒකකය	05
ඉහුරු/කහ පෙති කපන යන්ත්‍ර	14
කහ පල්පර සෑදීමේ යන්ත්‍රය	01
කුරුඳු කැබලි කිරීමේ යන්ත්‍රය	01
තරාදිය	01
පොලිතීන් සීලර්	02
ආරක්ෂිත කමත	01
තණකොළ කැපීමේ යන්ත්‍ර	04
ඇලුමිනියම් ඉනිමග	03
වගා බිමේ පැළ සිටුවීම සඳහා වලවල් හාරන යන්ත්‍ර	03

- 2022 වසරේ දී ද වාර්ෂිකව පැවැත්වෙන නැවුම් කුරුඳු මංගල්‍යය, දෙසැම්බර් මස 17 වන දින අඹණ්ඩව අමාත්‍යාතුමා, අමාත්‍යාංශ නිළධාරීන් , දෙපාර්තමේන්තු නිළධාරීන් හා කුරුඳු වගාකරුවන්ගේ සහභාගීත්වයෙන් ගාල්ල, සීනිගම දෙවොල් දේවාල භූමි පරිශ්‍රයේදී උත්කර්ෂවත් ලෙස පවත්වන ලදි.

- 2022 වසරේ දී ද අපනයන කෘෂි බෝගයන් පිළිබඳ තාක්ෂණික දැනුම හා එම බෝගයන් ප්‍රවර්ධනය කරලීම උදෙසා ජනමාධ්‍ය යොදා ගැනමේ ක්‍රමවේදය ඔස්සේ දෙපාර්තමේන්තුවේ සියළුම පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් මෙන්ම පර්යේෂණ හා තාක්ෂණික කරුණු ගොවි ජනතාව වෙත සන්නිවේදනය පහසු කිරීම සඳහා ජාතික රූපවාහිනිය ඔස්සේ "සැහවුණු කහවණු" නමින් වාර්තා වැඩසටහන් 24 ක් හා "රන්මසු උයන" නමින් වැඩසටහන් 23ක් ද විකාශනය කරන ලදි .ගුවන් විදුලි වැඩසටහන් යටතේ කඳුරට ,රුහුණු ,වෙළඳ ,රජරට හා වයඹ ගුවන් විදුලි සේවා ඔස්සේ "රස ජනනී" වැඩසටහන් 47ක් ද ස්වාධීන සේවය ඔස්සේ "හරිත මංසල"වැඩසටහන් 24 ක් විකාශනය කරන ලදි .තවද අපනයන කෘෂි බෝග පුවත්පත් දැන්වීම් 06 ක් විකාශනය කරන ලද අතර, පුවත්පත් දැන්වීම් 711 ක් ද, තාක්ෂණික පොත් 1477 ක් හා පුවත්පත් මිලදී ගැනීම් 711 ක් හා අපනයන කෘෂිබෝග පැළ මිල ගණන් සතිපතා දිනමිණ පුවත්පත් දැන්වීම් පළ කිරීම් 45 ක් හා අපනයන කෘෂි බෝග අත්පත්‍රිකා 10,000 ක් ද, 1920 කෘෂි උපදේශන සේවාව ඔස්සේ අපනයන කෘෂි බෝග පිළිබඳ සේවා දායකයන් 4885 ක් සඳහා දුරකථනය ඔස්සේ උපදේශන සේවාවන් සපයන ලදි. තවද අපනයන කෘෂි බෝග

පිළිබඳ ප්‍රදර්ශන 05 ක් පැවැත්වීමට කටයුතු කරන ලදී.

පාර්ශ්වකරුවන් දැනුමෙන්, ආකල්පයෙන් හා කුසලතාවයෙන් පිරිපුන් පුද්ගලයින් බවට පත් කරලීමේ අරමුණින් යුතුව මාතලේ සේවා සංස්කරණ පුහුණු මධ්‍යස්ථානය 2022 වසර තුල සාමාන්‍ය පුහුණු වැඩමුළු හා පුහුණු වැඩසටහන් මෙන්ම මාර්ගගත ක්‍රමය ඔස්සේ ද පුහුණු වැඩසටහන් රාශියක් සිදු කරන ලදී. දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා සම්මන්ත්‍රණ , වැඩමුළු හා පුහුණු වැඩසටහන් අවශ්‍යතාවයන් පරිදි පවත්වන ලද අතර, බාහිර ආයතන හා උසස් අධ්‍යාපන ආයතනවල ඉල්ලීම් පරිදි විශේෂිත තාක්ෂණික පුහුණු සැසි හා වැඩසටහන් පුහුණු මධ්‍යස්ථාන තුල මෙන්ම අදාල ආයතන පරිශ්‍රවලදී ද පවත්වන ලදි. 2022 වසරේ සේවා සංස්කරණ පුහුණු මධ්‍යස්ථානය මඟින් කෘෂිකර්ම විද්‍යාල, ජාතික වැවිලි කළමනාකරණ ආයතනය, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, වර්ල්ඩ් විෂන් ලංකා, කාර්මික විද්‍යාල ආදිය තාක්ෂණික පුහුණු ලබාගත් බාහිර සේවා ලාභී ආයතනයන් වේ. එමෙන්ම ගොවි පුහුණු වැඩසටහන් මාතලේ, මහනුවර හා කුරුණෑගල දිස්ත්‍රික්ක කේන්ද්‍ර කර ගනිමින් 2022 වසර තුල පැවැතුන ප්‍රවාහන දුෂ්කරතාවලටද මුහුණු දෙමින් ඉහළ ආකර්ෂණයක් යටතේ පවත්වන ලදී. පශ්චාත් කොවිඩ් තත්වයක් තුල ඉතා ඉහළ සාර්ථකත්වයක් යටතේ මාර්ගගත පුහුණු වැඩසටහන් වඩාත් විධිමත් ලෙස අඟහරුවාදා ගොවි පුහුණු හා බ්‍රහස්පතින්දා අපනයන කෘෂිකර්ම ව්‍යවසායකත්ව ලෙස පුහුණු වැඩසටහන් මාලා 02 ක් සජීවීව මුහුණු පොත හා යූ ටියුබ් නාලිකා හරහා විකාශනය කරන ලදී. මේ යටතේ වසර පුරා මාර්ගගත පුහුණු 41 ක් පවත්වා ප්‍රතිලාභීන් 92,418 දෙනෙකු බිහි කර ඇත. ඊට අමතරව 2022 වසරේ පුහුණු වැඩසටහන් 16 ක් භෞතික වශයෙන් ද පවත්වා හා එමඟින් පුහුණුලාභීන් 709 දෙනෙකු සඳහා අපනයන කෘෂි බෝග පුහුණු වැඩසටහන් පවත්වන ලදි.

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50%- 74%
වගා කරන ලද හෙක්ටයාර් ප්‍රමාණය			74
වගාව සඳහා නිකුත් කරන ලද පැළ සංඛ්‍යාව	100	-	-
සංවර්ධනය කරන ලද මධ්‍යම පැළ තවාන් සංඛ්‍යාව	100		-
පාළු පැළ සිටුවීම මඟින් ඵලදායිතාවය ඉහළ නංවන ලද ඉඩම් ප්‍රමාණය	93		-
ස්ථාපිත කරන ලද ක්ෂුද්‍ර ජලසම්පාදන පද්ධති ප්‍රමාණය		-	20
ස්ථාපිත කරන ලද සත්ව හානි වැටවල් ප්‍රමාණය	-		48
කාබනික අපනයන වගා හෙක්ටයාර ප්‍රමාණය	100		-
බෙදා හරින ලද පසු අස්වනු තාක්ෂණ උපකරන ප්‍රමාණය		-	39
කුඩා පරිමාණ ගෙවතු	96%		
ගෙවතු සඳහා පැළ			7
පොකුරු ගම්මාන වැඩසටහන			27
කහ සහ ඉඟුරු ආයෝජන ආධාර වැඩසටහන			34
පුවක් වගාව	100%		

මාතලේ මධ්‍යම පර්යේෂණ මධ්‍යස්ථානය විසින් EAC භෝග සඳහා පුහුණු වැඩසටහන් 19 ක් පවත්වන ලදී. මධ්‍යම පර්යේෂණ මධ්‍යස්ථානයේ රසායනාගාර තුළ සාම්පල 80ක් පරීක්ෂා කර ඇත. තවද, මාතර කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය විසින් කුරුඳු වගාව වැඩිදියුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන් 90 ක් සහ කුරුඳු අගය එකතු කිරීම සහ තෙල් නිස්සාරණය පිළිබඳ එක් මාර්ගගත පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. අන්තර් භෝග හා බුලත් පර්යේෂණ ස්ථානය මගින් බුලත් පුහුණු වැඩසටහන් 9ක් පවත්වා ඇත.

අපනයන කෘෂිකාර්මික භෝග පිළිබඳ පර්යේෂණ හා ඒකාබද්ධ පළිබෝධ සහ රෝග කළමනාකරණ වැඩසටහන අපනයන කෘෂිකාර්මික භෝගවලින් උපරිම නිෂ්පාදනය සහ ඉහළ ගුණාත්මක බව අවධාරණය කරයි. මෙහිදී මධ්‍යස්ථාන 08 ක් හරහා මෙම ක්‍රියාකාරීත්වය සිදුවේ.

4.1.2. ගොඩනැඟිලි ඉදිකිරීම් , අළුත්වැඩියා, ඉඩම් සංවර්ධනය හා යටිතල පහසුකම්

අපනයන කෘෂි බෝග සංවර්ධන වැඩසටහන හා අපනයන කෘෂි බෝග පර්යේෂණ සහ ඒකාබද්ධ රෝග හා පළිබෝධ කළමණාකරණ (IPM) වැඩසටහන යන වැඩසටහන් 02 යටතේ ගොඩනැඟිලි අළුත්වැඩියා හා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රුපියල් මිලියන 14 ක ප්‍රතිපාදන 2022 වසර සඳහා වෙන් වූ අතර මෙම ප්‍රතිපාදන කාර්තු වශයෙන් වියදම් කිරීමට යටත්ව ලබා දුනි. ඒ අනුව පළමු කාර්තුව සඳහා වෙන් වූ ප්‍රතිපාදන සඳහා අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කළ අතර ඒ යටතේ අපේක්ෂිත නිමැවුම 100% මට්ටමට ළඟා වීමට හැකි වුවත් භාණ්ඩාගාර ලේකම් ගේ රාජ්‍ය වියදම් පාලනය සඳහා වූ චක්‍රලේඛ අංක BD/CBP/01/01/04-2022 හා 2022.04.26 දිනැති චක්‍රලේඛය මඟින් රාජ්‍ය වියදම් සීමා කිරීම හේතුවෙන් සැලසුම් කළ අනෙකුත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50%- 74%
ගොඩනැඟිලි අළුත්වැඩියාවන් සම්පූර්ණ කළ ප්‍රමාණය	100		
සම්පූර්ණ කරන ලද යටිතල පහසුකම් ව්‍යාපෘති ප්‍රමාණය	100		

පරිච්ඡේදය 05

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1. දෙපාර්තමේන්තුවට අදාලව හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු.

ඉලක්ක අංක 01:- සෑමතැනම සෑම ආකාරයකම දරිද්‍රතාවය අවසන් කිරීම.

1.4. වර්ෂ 2030 පමණ වන විට සියළුම, විශේෂයෙන්ම දිළිඳු හා අවදානමට ලක්විය හැකි පුරුෂයින් හා ස්ත්‍රීන් හට ආර්ථික සම්පත් වලට සමාන අයිතිවාසිකම් මෙන්ම මූලික සේවාවන්ට ප්‍රවේශය ද , භූමිය හා වෙනත් ආකාරයේ දේපළ , උරුමය, ස්වභාවික සම්පත් අයිතිකාරීත්වය හා පාලනය ද ක්ෂුද්‍ර මූල්‍ය ද ඇතුළුව නවීන තාක්ෂණය හා මූල්‍ය සේවා භාවිතයට ගැනීමට ඇති හැකියාව ද සහතික කළ යුතුය. මේ යටතේ එතෙක් 50% ක පිරිවැය දරා රෝපණ ද්‍රව්‍ය සපයා ක්‍රියාත්මක කළ වගා ව්‍යාපෘති මෙම වර්ෂය තුළ 100% ගොවීන් වෙත ලබා දී වගාව සඳහා ගොවීන් දිරිගැන්වූ අතර ඒ තුළින් ස්ව නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කිරීමට හැකිවිය.

1.b. දරිද්‍රතාවය මූලෝත්ගමනය කිරීමේ ක්‍රියාමාර්ග සඳහා වූ වේගවත් ආයෝජනයන්ට ආධාර කිරීමට දිළිඳු ජනතාව හා ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වූ සංවර්ධන උපාය මාර්ග මූලික කොටගත් ප්‍රතිපත්ති රාමුවක් ජාතික , ප්‍රාදේශිය සහ ජාත්‍යන්තර මට්ටම්වලින් නිර්මාණය කිරීම ඊට අනුගත වෙමින් කුඩා පරිමාණව හෝ වගාව සඳහා මහ ජනතාව යොමු කිරීම සඳහා කුඩා පරිමාණ ගෙවතු වගා වැඩසටහන් ක්‍රියාවට නංවන ලදි.

ඉලක්ක අංක 02:- කුසගින්න අවසන් කිරීම, අහාර සුරක්ෂිතතාවය හා පෝෂණය ඉහළ නැංවීම සාක්ෂාත් කර ගැනීම හා තිරසාර කෘෂිකර්මාන්තය ඉහළ නැංවීම, පාංශු සංරක්ෂණ ක්‍රම භාවිතය, දේශගුණික වෙනස්කම් සඳහා ඔරොත්තු දෙන කෘෂි තාක්ෂණය භාවිතයට සහභාගී වීම, කාබනික වගාව ප්‍රවලිත කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාවට නංවන ලදි.

2.3. භූමිය සඳහා ආරක්ෂිත හා සමාන ප්‍රවේශය, වෙනත් නිෂ්පාදන සම්පත් හා යෙදවුම්, දැනුම, මූල්‍ය සේවා, වෙළඳපල අගය එකතු කිරීම සහ නොයෙක් රැකියා සඳහා අවස්ථා ඇති කිරීම තුළින් විශේෂයෙන්ම කාන්තාවන්, ස්වදේශිය ජනතාව, ගොවියන්, පශු කර්මාන්තකරුවන් සහ ධීවරයින්ගේ කෘෂිකාර්මික ඵලදායිතාව සහ කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ ආදායම වර්ෂ 2030 පමණ වන විට දෙගුණ කිරීම, පුහුණු වැඩසටහන්, ක්ෂේත්‍ර නිරීක්ෂණ, හා අනෙකුත් ඵලදායීතා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාවට නංවන ලදි.

2.4. ඵලදායිතාවය හා නිෂ්පාදනය ඉහළ නංවන පරිසර පද්ධති ආරක්ෂා කර ගැනීමට උනන්දු වන , දේශගුණික වෙනස් වීම්, අන්තගාමී දේශගුණය, නියං, ජල ගැලීම්,සහ වෙනත් ව්‍යසනයන්ට අනුවර්තනය වීමේ හැකියාව ශක්තිමත් කරන භූමි සහ පාංශු ගුණාත්මක බව වඩ වඩා ඉහළ නංවන

ප්‍රත්‍යාස්ථ කෘෂිකාර්මික පුරුදු ක්‍රියාවන්ට නැංවීම හා තිරසාර ආහාර නිෂ්පාදන පද්ධතීන් වර්ෂ 2030 පමණ වන විට ඇති කරන බවට සහතික කළ යුතුය.

2.5. 2020 වන විට ජාතික, ප්‍රාදේශීය සහ අන්තර්ජාතික මට්ටම්වලින් මනාව කළමණාකරණය කරනු ලබන සහ විවිධාංගීකරණයට ලක් කරන ලද බීජ සහ පැළැටි බැංකු පිහිටුවීම තුළින් බීජවල සහ ගොවිපළගත හීලෑ කරන ලද සතුන් සහ ඔවුන්ටඥාති සම්බන්ධතා දක්වන සතුන් වර්ගවල ජානමය විවිධත්වය පවත්වා ගෙන යාම සහ අන්තර්ජාතික ගිවිසුම් වලට අනුකූලව ජානමය සම්පත් හා ආශ්‍රිත සම්ප්‍රදායික දැනුම භාවිතාව තුළින් ජනනය වන ප්‍රතිලාභ සාධාරණව සහ සමානව බෙදා හදා ගැනීමකට ඇති ප්‍රවේශය පුළුල් කිරීම.

2.a. වැඩි අන්තර්ජාතික සහයෝගීතාව තුළින්, ඌන සංවර්ධිත රටවල් ද ඇතුළත්ව , සංවර්ධනය වෙමින් පවතින රටවල කෘෂිකාර්මික ඵලදායිතා ධාරිතාව ඉහළ නැංවීම සඳහා ග්‍රාමීය යටිතල පහසුකම්, කෘෂිකාර්මික පර්යේෂණ සහ ව්‍යාප්ත සේවා , තාක්ෂණවේදය සංවර්ධනය කිරීම සහ පැළැටි සහ පශු සම්පත් ජාන බැංකුවල ආයෝජනය වැඩි කිරීම.

ඉලක්ක 04:- සියළු දෙනාටම සාධාරණාත්මක හා ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සියල්ලන්ටම යාවජීව අධ්‍යාපන අවස්ථා ඉහළ නැංවීම.

4.3. වර්ෂ 2030 පමණ වන විට සියළුම කාන්තා හා පුරුෂ පාර්ශවයන්ට විශ්ව විද්‍යාල ද ඇතුළත්ව දැරිය හැකි හා ගුණාත්මක බවින් යුතු තාක්ෂණික වෘත්තීය හා තෘතියික අධ්‍යාපනය සඳහා සමාන ප්‍රවේශ අවස්ථා සහතික කිරීම.

4.7. තිරසාර සංවර්ධනය සහ තිරසාර ජීවන ක්‍රම, මානව හිමිකම්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, ප්‍රචණ්ඩත්වයෙන් තොර සාමකාමී සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවය හා සංස්කෘතික විවිධත්වය අගය කිරීම, තිරසාර සංවර්ධනය සඳහා සංස්කෘතියේ දායකත්වය ආදි කරුණු තුළින් වර්ෂ 2030 පමණ වන විට සියළුම ආධුනිකයන් විසින් තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය දැනුම සහ නිපුණතාවයන් අත් කර ගෙන ඇති බවට සහතික කළ යුතුය.

ඉලක්ක 17:- තිරසර සංවර්ධනය සඳහා වන ගෝලීය සහභාගීත්වය ක්‍රියාවට නැංවීම හා යළි නඟා සිටුවීම ශක්තිමත් කිරීම.

17.11.2020 දී අඩු දියුණු රටවල ගෝලීය අපනයන කොටස් දෙගුණ කිරීම ඇතුළත්ව සංවර්ධනය වන රටවල අපනයනය කැපී පෙනෙන ලෙස වර්ධනය කිරීම.

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

තිරසර සංවර්ධන ඉලක්කය සපුරා ගැනීමේ අරමුණින් යුතුව 2022 වසර තුලදී හා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් විවිධ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. පැවැති ආර්ථික හා බලශක්ති අර්බුදයන් හමුවේ වුවද සංවර්ධන වැඩසටහන් ක්‍රියාවට නැංවීම මඟින් අපනයන කෘෂි බෝග ක්ෂේත්‍රය කෙරෙහි පාර්ශ්වකරුවන් ආකර්ෂණය කර ගැනීම , ගොවීන්ගේ වගා වපසරිය ඉහළ නැංවීම මෙන්ම අපනයන භෝග ක්ෂේත්‍රයේ නිරත සියළු පාර්ශවකරුවන්ගේ ආදායම් ඉහළ නැංවීම ඉලක්ක කරන ලදී. ඒ අනුව, අපනයන කෘෂි බෝග නව වගා වපසරිය හෙක්ටයාර 272.11 ප්‍රමාණයක් නව වගාවන් ලෙස ආරම්භ කරන ලද අතර. ඒ සඳහා අවශ්‍ය අපනයන කෘෂි බෝග පැළ 1,147,925 ක ප්‍රමාණයක් 2022 සැප්තැම්බර් මස 26 වන දින සිට අදාල ප්‍රතිලාභීන් වන ගොවීන් වෙත ලබා දෙන ලදී . රට තුල පැවැති ආර්ථික මෙන්ම බලශක්ති අර්බුද හමුවේ දෙපාර්තමේන්තුවේ සංවර්ධන වැඩසටහන් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන සීමා වීම හේතුවෙන් ඉලක්කගත නව වගා වපසරිය 2021 වසරට වඩා පහළ මට්ටමක් කරා යාමට සිදුවීම 2022 වසරේ දී සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අභියෝගයක් විය.

- තිරසර සංවර්ධන ඉලක්ක කරා යාමේදී, ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම සෞඛ්‍ය හා පෝෂණය වර්ධනය කිරීම සඳහා ආර්ථික ශක්‍යතාවයෙන් යුතු අපනයන කෘෂි බෝග ආදර්ශ ගෙවතු ස්ථාපනය කිරීම හා අපනයන බෝග ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන තුලින් අපනයන කෘෂි බෝග ආර්ථික ගෙවතු, අපනයන බෝග ප්‍රවර්ධන වැඩසටහන හා ගෙවතු සඳහා කහ/ඉඟුරු පැළ ලබා දීමේ උප වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ආර්ථික ගෙවතු වගා වැඩසටහන යටතේ වගා කළ හැකි වපසරිය අවම වශයෙන් පර්චස් 20 ක් හා උපරිමය පර්චස් 39 ක ඉඩමක් හිමි අපනයන කෘෂි බෝග වගා කිරීමට කැමැත්තක් දක්වන ප්‍රතිලාභීන් සඳහා අපනයන කෘෂි බෝග පැළ /බීජ ලබා දෙන ලදී. මේ යටතේ ගෙවතු 32,198 ක් ස්ථාපිත කරන ලදී.

- අපනයන කෘෂි බෝග ජනතාව අතර ප්‍රචලිත කිරීම හා හඳුන්වාදීම අරමුණු කර ගනිමින් අපනයන බෝග ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ රාජ්‍ය/ රාජ්‍ය නොවන / පුද්ගලික ආයතන විවිධ ප්‍රජා සංවිධාන සමිති මඟින් සිදු කරන ඉල්ලීම් සඳහා මේ යටතේ පැළ ලබා දෙන ලදී.

- නාගරික හා අර්ධ නාගරික නිවාස ඉලක්ක කර ගනිමින් ගෘහස්ථ පරිභෝජන සඳහා අවශ්‍ය කහ සහ ඉඟුරු අවශ්‍යතාවය ගෙවත්ත තුලින්ම නිෂ්පාදනය කිරීම මෙමඟින් බලාපොරොත්තු වන ලදී. ඒ යටතේ එක් ගෘහයක් සඳහා අවශ්‍යතාවය පරිදි කහ පැළ උපරිමය දක්වාත් , ඉඟුරු පැළ 05 ක් දක්වා නොමිලයේ නිකුත් කරන ලදී. මේ යටතේ කහ සහ ඉඟුරු පැළ ගොවි සමිති, ග්‍රාමීය සංවිධාන, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන , පෞද්ගලික ආයතන වලින් කරන ලද ඉල්ලීම් වලට අනුව ලබා දෙන ලදී. එසේ වුවද ප්‍රමාණවත් ප්‍රතිපාදනයන් සීමා වීම හා ඉන්ධන

අර්බුදයන් හේතුවෙන් හෙක්ටයාර 20.7 ක් සඳහා ඉහුරු පැළ ලබා දෙන ලදී.

- තිරසාර පරිභෝජන හා නිෂ්පාදන රටා සුරක්ෂිත කිරීම ආරක්ෂා කර ගැනීමේ අරමුණින් යුතුව රජය ඒ ඒ ප්‍රදේශයට ආවේණික හා නිර්දේශිත වූ පාරිසරික , සාමජීය හා කෘෂිකාර්මික කරුණු සැලකිල්ලට ගෙන ආර්ථිකමය වශයෙන් ඉහළ ප්‍රතිලාභයක් ලබා ගැනීමට අපනයන විභවයක් පවතින බෝග වර්ග හඳුනාගෙන ශ්‍රී ලාංකීය ප්‍රජාව තුල අපනයන බෝග ප්‍රවර්ධනය කර ආර්ථිකය ශක්තිමත් කර අපනයන කෘෂි බෝගවල ජාතික නිෂ්පාදන ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් අපනයන කෘෂි කලාප වැඩසටහන 2022 වසර තුලදී ද ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ අක්කර ¼ සිට අක්කර 05 දක්වා කුරුඳු සහ ගම්මිරිස් පැළ ලබා දෙන ලදී.

- තිරසාර සංවර්ධන ඉලක්ක අත්පත් කර ගැනීමේ දී පරිසර සංරක්ෂණය ප්‍රධාන අංගයක් ලෙස සැලකෙන අතර, පාංශු හා ජල සංරක්ෂණය කරමින් ආදායම වැඩි කිරීම සඳහා පුවක් වගාව ව්‍යාප්ත කිරීමේ වැඩසටහන 2022 වසරේදී ද ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන යටතේ , තනි වගාවක්, අතුරු හෝ මිශ්‍ර වගාවක් ලෙස වාරිමාර්ග දෙපස, ජල පෝෂක ප්‍රදේශ,මාර්ග දෙපස හා වගා ඉඩම් තුල, පරිසර සංරක්ෂණ කටයුතු සිදු කරන ස්ථාන, වතු සමාගම් ආදිය සඳහා පුවක් පැළ 183,859ක් නොමිලයේ නිකුත් කර ඇත.
- දේශගුණික විපර්යාසයන් හා ස්වභාවික විපත්වලට නිරන්තරයෙන් ලක්විය හැකි බැවින් ඒ සඳහා අනුවර්තනය වීමේ හැකියාව වර්ධනය කිරීම හා තිරසාර ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය වඩා තහවුරු කිරීම සඳහා අපනයන බෝග වගාවන්හි ඵලදාව ඉහළ නංවාලීමේ වැඩසටහන් රැසක් 2022 වසරේ දී ක්‍රියාත්මක කරන ලදී. දේශගුණික විපර්යාසයන් සඳහා කඩිනමින් ප්‍රතිචාර දැක්වීම හා තිරසාර ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය යටතේ ගම්මිරිස් හා කුරුඳු වගාවේ පවතින පාළු සිටුවීම සඳහා පැළ නොමිලේ ලබා දීම සිදු කරන ලද අතර, එමගින් ඵලදායීතාවය ඉහළ නැංවීම අපේක්ෂා කරන ලදි. එහිදී, හෙක්ටයාර් 828.85 ක් සඳහා නොමිලයේ අපනයන කෘෂි බෝග පැළ ලබා දෙන ලදී. තවද, පළිබෝධ හානි වැළැක්වීම සඳහා උපාංග/ පද්ධති ලබා දීම සඳහා වැයවන වියදමින් 50% ක ආයෝජන ආධාර ලබා දෙන ලදී. ඒ යටතේ උපකරණ/ පද්ධති 12 ක් ලබා දෙන ලදී. වගාවන්ට ස්වාභාවිකව සිදුවන නියං හානි වළක්වා ගැනීම සඳහා විසුරුම් ජල පද්ධති / බිංදු ජල සම්පාදන පද්ධති සඳහා වැයවන වියදමින් 50% ක සඳහා ආයෝජන ආධාර මුදල් ගොවීන් දෙදෙනෙකු වෙත ලබා දෙන ලදී.
- "හරිත සමාජ ආර්ථික රටාවක්" යන තේමාව යටතේ සෞඛ්‍යාරක්ෂිත ආහාර නිෂ්පාදනයන් හරහා නීරෝගීමත් ජනතාවක් බිහි කිරීමේ අරමුණින් යුතුව පරිසර හිතකාමී අපනයන කෘෂි බෝග වගා වැඩසටහන 2022 වසර තුලදීද ක්‍රියාත්මක කරන ලදී. අපනයන කෘෂි බෝග වගාවන් සඳහා කාබනික යෙදවුම් භාවිතා කරමින්, නිවැරදි කෘෂිකාර්මික පිළිවෙත් හා කාර්යක්ෂම ජල කළමනාකරණය අනුගමනය කිරීම මඟින් වස විමෙන් තොර ගුණාත්මක අපනයන බෝග නිෂ්පාදන කරා යොමු වීමේ අරමුණින් යුතුව පරිසර හිතකාමී අපනයන කෘෂි

බෝග වගාවන් සඳහා ගොවීන් දිරි ගන්වන ලදී. මෙහිදි කාබනික වගාවන් සඳහා අපනයන බෝග වගාවන් සඳහා නිර්දේශ ක්‍රියාත්මක කරන ලද අතර, එවැනි නිර්දේශයන් අනුගමනය කරනු ලබන ඉඩම් පොකුරු ගොවිපල පද්ධතියක් ලෙස කාබනික සහතිකකරණ වැඩසටහනට සම්බන්ධ කරන ලදී.

- ඒ ඒ ප්‍රදේශයට ආවේණික හා නිර්දේශිත වූ පාරිසරික, සමාජීය හා කෘෂිකාර්මික කරුණු සැලකිල්ලට ගනිමින් ආර්ථිකමය වශයෙන් ඉහල ප්‍රතිලාභයක් ලබා ගැනීමට විභවයක් පවතින අපනයන කෘෂි බෝග වර්ගය හඳුනා ගැනීම මෙහිදී සිදු කෙරේ. ස්ථාපිත කරනු ලබන අපනයන කෘෂි කලාපයක් තුළ වගාව, නිෂ්පාදන පිරිසැකසුම්කරණය, අගය එකතු කිරීම, විකිණීම සහ අපනයනය මෙන්ම සම්පූර්ණ අගය දාමය සහතික කිරීම, ප්‍රතීතනය සහ කළමනාකරණය කිරීම යනාදී ක්‍රියාකාරකම් තුළින් නිෂ්පාදනයේ අගය දාමය සංවර්ධනය කිරීම සිදු කිරීම සඳහා පහසුකම් සැපයීම සිදු කෙරේ. මෙම වැඩසටහන මඟින් ග්‍රාමීය ජනතාව ඒකරාශි කරමින් ජාතික හා ජාත්‍යන්තර වෙළඳපොළ මෙන්ම නිකේතනීය වෙළඳපොළ ඉලක්ක කොට නිෂ්පාදන සිදු කිරීම අපේක්ෂා කරන ලදී. 2022 වසර තුල අපනයන කෘෂි කලාප වැඩසටහන දියත් කරන ලද අතර මෙම වැඩසටහන යටතේ කුරුඳු , ගම්මිරිස්, වැනිලා, පැහිරි, කරඳමුංගු , කහ, ඉඟුරු සහ කෝපි පැළ 11,959,071 ක් බෙදා දෙන ලදී.

- තිරසාර පරිභෝජන රටා සහ නිෂ්පාදන සුරක්ෂිත කිරීමේ තිරසර ඉලක්ක අත්පත් කර ගැනීමෙහිලා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (Good Agricultural Practices) හා යහපත් නිෂ්පාදන පිළිවෙත් (Good Manufacturing Practices)ක්ෂේත්‍රය තුළ ප්‍රවර්ධනය සඳහා වූ වැඩසටහන් 2022 වසරේදී ක්‍රියාවට නංවන ලදි. එහිදී, අගය එකතු කළ නිෂ්පාදන දිරිගැන්වීම හා කාබනික වගාව දිරිගැන්වීමට ද පියවර ගන්නා ලද අතර, හෙක්ටයාර 43.7 ක් සඳහා වගා වපසරියක කාබනික ගම්මාන වැඩසටහන ක්‍රියාවට නංවන ලදි. ලෝකයේ කාබනික වගා නිෂ්පාදන සඳහා වැඩි ඉල්ලුමක් පවතින හෙයින් කාබනික නිෂ්පාදන දිරිමත් කර වස විසෙන් තොර ආහාර රටාවකට ජනතාව යොමු කරවීම හා ඒ තුලින් සෞඛ්‍ය සම්පන්න ජීවිත තහවුරු කරලීම අරමුණින් යුතුව , කාබනික වගා ගම්මාන සඳහා කාබනික වගා සහතික ලබා දීමට දෙපාර්තමේන්තුව මගින් අවශ්‍ය සහාය ලබා දෙනු ලැබූ අතර, කාබනික වගා වැඩසටහන මඟින් කාබනික නිෂ්පාදනයන් අන්තර්ජාතිකව ඉහළ මිලකට අලෙවි කිරීමේ හා ඒ මඟින් ජනතාවගේ ආර්ථිකය ඉහළ නංවාලීම අපේක්ෂා කරන ලදී.
- වැඩි විදේශ විනිමයක් උපයා ගැනීම අරමුණු පෙරදැරිව අගය එකතු කළ නිෂ්පාදන දිරිගැන්වීම, අපනයන බෝග ආශ්‍රිත නිෂ්පාදන වල ගුණාත්මකභාවය ඉහළ දැමීම යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (Good Agricultural Practices)(GAP)හා යහපත් නිෂ්පාදන පිළිවෙත් (Good Manufacturing Practices (GMP)ප්‍රවර්ධනය සඳහා විවිධ ක්‍රියාමාර්ග දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන ලදි. යහපත් කෘෂිකාර්මික පිළිවෙත් වැඩසටහන යටතේ අදාල ප්‍රමිතීන් සකස් කිරීම සහ භාවිත සංග්‍රහ සකස් කිරීම සිදුකරන ලදී.

- උචිත තාක්ෂණය භාවිතයෙන් අපනයන කෘෂිබෝග ගුණාත්මය වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ අස්වනු සැකසීමේ නවීන තාක්ෂණික උපකරණ / යන්ත්‍රසූත්‍ර / ගොඩනැඟිලි / පහසුකම් හඳුන්වා දීම හා සැපයීමේ ක්‍රියාවලියක් පමණක්ම නොව අපනයන බෝග වගාවන්ගේ ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රියාමාර්ග ඉටු කිරීමට, දේශීය හා විදේශීය ප්‍රමිතීන්ට අනුව යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) අනුගමනය කරමින් අපනයන කෘෂිබෝග නිෂ්පාදනයන් හි ගුණාත්මය වැඩිදියුණු කිරීම, අගය එකතු කල නිෂ්පාදන දිරිගැන්වීම (Value Addition), රැකියා උත්පාදනය ඉහල නැංවීම අපේක්ෂා කරන ලදී.

- වසර 2030 වන විට සහශ්‍ර සංවර්ධන ඉලක්ක කර ගනිමින්, අපනයන කෘෂිබෝග වගා ක්ෂේත්‍රයේ නියැලී සිටින සියළුම පාර්ශවයන් වෙත දැනුම හා කුසලතා ප්‍රවර්ධනය සඳහා පුහුණු වැඩසටහන් හා ක්ෂේත්‍ර දින 2022 වසරේ දී පවත්වන ලදී. රට තුල පැවැති කොරෝනා තත්වය හමුවේ පුහුණු වැඩසටහන් පැවැත්වීමට බාධාවක් වුවද, යහපත් කෘෂිකාර්මික පිළිවෙත් හා යහපත් නිෂ්පාදන පිළිවෙත් හා අනෙකුත් පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු යොදන ලදී.

- ගොවි ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කරලීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය වන්නා වූ පසුබිම සකස් කිරීම උපයෝගී වන්නාවූ වක්‍රලේඛ , වැඩසටහන් හා උපායමාර්ග දෙපාර්තමේන්තු මට්ටමින් සිදු කරන ලදි. මෙමඟින් අපනයන කෘෂි බෝග ක්ෂේත්‍රය සඳහා උනන්දු වන සියළුම පාර්ශ්වයන්ගේ ආර්ථිකය ශක්තිමත් කරමින් දරිද්‍රතාවය පිටු දැකීම සඳහා අවශ්‍ය ආර්ථික සම්පත් සඳහා වූ ප්‍රවේශය තහවුරු කරන ලදි. ඒ මඟින් සෘජුවම වගාකරුවන් ගේ ආදායම ඉහළ නැංවීම සඳහා දෙපාර්තමේන්තුව විසින් 2022 වසරේ දී දායකත්වය ලබා දෙන ලදි.

- එහෙත් කෘෂි ව්‍යාප්ති සේවාවෙහි ඵලදායිතාව හා කාර්යක්ෂමතාව ඉහළ නංවා ඒ ඔස්සේ අපනයන ආදායම ඉලක්ක වැඩි කිරීම සඳහා ප්‍රමාණවත් භෞතික සම්පත් , මානව සම්පත සහ ව්‍යාප්ති නිළධාරී කාර්යාලවල ප්‍රමාණවත් පහසුකම් නොමැති වීම 2022 වසර තුලදී ද මුහුණු දුන් අභියෝගයන් ලෙස පැවැතිනි.

පරිච්ඡේදය 06

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමණාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	85	61	24
තෘතියික	29	08	21
ද්විතියික	800	707	93
ප්‍රාථමික	466	330	136
එකතුව	1380	1106	274

6.2 . ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපා ඇති ආකාරය

පළපුරුදු කාර්ය මණ්ඩලය විශ්‍රාම ගැනීම සහ ඒ සඳහා යොදවනු ලබන නව කාර්ය මණ්ඩලය තුළ අදාල ක්ෂේත්‍රයේ රාජකාරි පිළිබඳව අවබෝධයක් නොමැතිකම ද ඉතිරිව සිටින පුහුණු කාර්ය මණ්ඩලය යොදවා ඉටු කර ගත යුතු කාර්යයන් වෙනුවෙන් යොදාගත හැකි නවීන යන්ත්‍ර සූත්‍ර ලබා ගැනීම සඳහා ප්‍රතිපාදන නොමැති වීම.

6.3. මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය රු'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
ලංසු කැඳවීමේ ලේඛන පිළියෙල කිරීම (ඉදිකිරීම් හා සේවා)	06	දින 02	42,000.00		දේශීය	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව ඉදිකිරීම් හා සේවා සම්බන්ධව ක්‍රියාකිරීමේ දී අදාලවන රෙගුලාසි හා විධිවිධාන පිළිබඳව දැනුවත් කිරීම මඟින් අදාල කටයුතු නිර්වද්‍යවතාවයෙන් යුතුව කාර්යක්ෂමව ඉටු කර ගැනීම.
වාර්ෂික භාණ්ඩ සම්ක්ෂණය	02	දින 02	20,000.00		දේශීය	ගබඩා කළමණාකරණය විෂයට අදාලව වාර්ෂික භාණ්ඩ සම්ක්ෂණය සිදු කිරීමට අදාලවන මූදල් රෙගුලාසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන පිළිබඳව දැනුවත් වීම මඟින් එම කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකර ගැනීමට හැකිවීම.
පුරවැසි හා සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වා දීමේ පුහුණුව	46	දින 01			දේශීය	රා.ප.ව. 05/2018 යටතේ හඳුන්වා දුන් පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක කිරීමට අදාලවන දැනුම හා මහ පෙන්වීම ලබා ගැනීම තුළින් අදාල කටයුතු නිවැරදිව ඉටු කර ගැනීමට අපේක්ෂිතය.

භාණි පාඩු හා මු.රේ. 104 යටතේ වූ පරීක්ෂණ	1	දින 01	5000.00		දේශීය	මු.රේ. 104 අනුව භාණි පාඩු සම්බන්ධව විධිමත්ව කටයුතු කිරීමට අදාල දැනුම හා උපදෙස් ලබා ගැනීම තුළින් එම කටයුතු යථා පරිදි ඉටු කර ගැනීමට හැකිවීම.
පුරවැසි හා සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වා දීමේ පුහුණුව	20	දින 01			දේශීය	රා.ප.ව. 05/2018 යටතේ හඳුන්වා දෙන ලද පුරවැසි සේවා ලාභී ප්‍රඥප්තිය දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක කිරීමට අදාලවන දැනුම හා මහ පෙන්වීම ලබා ගැනීම තුලින් අදාල කටයුතු නිවැරදිව ඉටු කර ගැනීමට අපේක්ෂිතය.
ඉඩම් ලිපිගොනු කඩිනම් කර ගැනීම සඳහා වූ පුහුණු වැඩසටහන	16	දින 03			දේශීය	දෙපාර්තමේන්තුව සතු ඉඩම් ගොඩනැඟිලි සම්බන්ධයෙන් දැනට නොවිසඳී ඇති ගැටළු සහගත තත්ත්වයන් නිරාකරණය කර ගැනීම සඳහා ඉදිරි කටයුතු කිරීමට අදාලව අවශ්‍යවන දැනුම , උපදෙස් හා මහපෙන්වීම ලබාගැනීම.
විනය කාරය පටිපාටිය	1		15,000.00		දේශීය	රාජ්‍ය නිලධාරීන්ගේ විනය සම්බන්ධයෙන් කටයුතු කිරීමට ආයතන සංග්‍රහයේ xxxxviii පරිච්ඡේදවල විධිවිධාන සම්බන්ධව දැනුවත් කිරීම.
පැය 150 දෙමළ භාෂා ප්‍රවීණතාවය ලබා ගැනීමේ පුහුණුව	49	2022.10.19 සිට 2023.01.25 දක්වා	87,550.00		දේශීය	රා.ප.ව. 7/2007 හා 1/2014 යටතේ ද්විතියක මට්ටමේ නිලධාරීන් ලබා ගත යුතු රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කර ගැනීම සඳහා අවශ්‍ය පුහුණුව ලබාදීම හා එමඟින් එම අවශ්‍යතාවය සම්පූර්ණ කර ගැනීමට අවස්ථාව සලසා දීම.
How to built paperless Office Environment	8	දින 01	52,000.00		දේශීය	ලිඛිත ලේඛන භාවිතය සීමා කර අවශ්‍ය ලේඛන තාක්ෂණික ක්‍රම භාවිතයෙන් ගබඩාකර ගැනීම සඳහා වන උපදෙස් හා පුහුණුව ලබාදීම තුළින් කඩදාසි භාවිතයෙන් තොර කාර්යාලයක් බිහිකිරීම සඳහා වන මහ පෙන්වීම ලබාදීම තුළින් වියදම් සීමා කිරීම.
යහපත් රාජ්‍ය සේවයක් උදෙසා විනය	30	දින 01			දේශීය	රාජ්‍ය නිලධාරීන්ගේ විනය සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන සම්බන්ධව සාකඡ්ඡා කර , යහපත් විනයානුකූල රාජ්‍ය සේවයක් විහිකිරීම සඳහා වන මහ පෙන්වීම ලබාදීම.
ආයතන කාර්ය පටිපාටිය	1	දින 12	20,000.00		දේශීය	ආයතන කාර්ය පටිපාටිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ රාජ්‍ය නිලධාරියෙකු දැන සිටිය යුතු මූලධර්ම හා ප්‍රායෝගික තත්ත්වයන් සම්බන්ධ පුහුණුව ලබා දීම තුළින් දැනුම කුසලතා ආකල්ප සපිරි රාජ්‍ය සේවකයින් බිහිකිරීම.

පරිච්ඡේදය 07

අනුකූලතා වාර්තාව

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම්	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ	අනුකූල වේ		
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම(වාණිජ අත්තිකාරම් ගිණුම)		අදාල නැත.	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම		අදාල නැත.	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම		අදාල නැත.	
1.6	වෙනත්		අදාල නැත.	
2	පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම(මු.රෙ.445)/	අනුකූල වේ		
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලබයි.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලබයි.		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම			
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

03	මූල්‍ය පාලනය සඳහා කාර්යන්අභිනියෝජනය කිරීම (මු.රෙ.135)	අනුකූල වේ		
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 17/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	වාර්ෂික සැලසුම් සකස් කිරීම			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	පෙර වර්ෂයේ දෙසැ.15 දිනට පිළියෙළ කර ඇත.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය ඇස්තමේන්තුවට (NB D) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	විගණන විමසුම්			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගනන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	ලබා දී ඇත.		
6	අභ්‍යන්තර විගණනය			
6.1	මු.රෙ.134(2)DMA/l-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව , අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	සකස් කර ඇත.		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	නැත.		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	විද්‍යුත් තැපෑල මඟින් ඉදිරිපත් කර ඇත.		
6.4	මු.රෙ.134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	ඉදිරිපත් කර ඇත.		
7	විගණන හා කළමණාකරණ කමිටු			

7.1	DMA චක්‍රලේඛ1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමණාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	2022 වර්ෂයට 04ක් පවත්වා ඇත.		
8	වත්කම් කළමණාකරණය			
8.1	අංක 01 /201.7 දරණ වත්කම් කළමණාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව , වත්කම් මිළදී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරනය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛය සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	වාහන කළමණාකරණය			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කොට තිබීම	අනුකූල වේ.		
9.3	වාහන ලොක් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ		

9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල නොවේ	Qr බෙදීම අංකයකින් ඉන්ධන ලබා දීම සීමා කිරීම හේතුවෙන් ප්‍රමාණවත් ඉන්ධන යෙදීමට නොහැකිවීම මත ඉන්ධන දහනය පරීක්ෂා කිරීම සිදු කළ නොහැකි වී ඇත.	ප්‍රමාණවත් ඉන්ධන ලබා ගැනීමට හැකි වූ පසු අදාල පරීක්ෂාකිරීම් යාවත්කාලීනව සිදු කළ හැකිවේ.
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත් වල අයිතිය පවරා ගැනීම	අනුකූල වේ		
10	බැංකු ගිණුම් කළමණාකරණය			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම		අක්‍රිය බැංකු ගිණුම් නොමැත.	
11	ප්‍රතිපාදන උපයෝජනය			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට ඵලබීම.	අනුකූල වේ		
12	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිහහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම.	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිහහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	පොදු තැන්පතු ගිණුම			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
14	අග්‍රිම ගිණුම්			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කාර තිබීම.	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ	අනුකූල වේ		

	තත්කාර්ය අතුරු අග්‍රිම , එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.			
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය , භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15	ආදායම් ගිණුම			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම් , තැන්පතු ගිණුමට බැර නොකොට ඍජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
16	මානව සම්පත් කළමණාකරණය			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
17	මහජනයා වෙත තොරතුරු ලබා දීම			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිලිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	සකස් කරමින් පවතී.		
18	පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමණාකරන අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට තිබීම.	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි	අනුකූල වේ		

	පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.			
19	මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ.		
19.3	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම,ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුනතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	නිවැරදි කර ඇත.		

ඇමුණුම 01 - අපනයන කෘෂි බෝගයන්හි ආනයන හා අපනයන පරිමාව -2022.

නිෂ්පාදනය	ඒකකය		ආනයන	අපනයන
කුරුඳු	පරිමාව	මෙට්‍රික් ටොන්	18.03	18,298.19
	වටිනාකම	රු. මි	52.35	71,716.17
කුරුඳු කොළ තෙල්	පරිමාව	මෙට්‍රික් ටොන්	0.11	194.38
	වටිනාකම	රු. මි	0.26	1,348.82
කුරුඳු පොතු තෙල්	පරිමාව	මෙට්‍රික් ටොන්	0.08	25.96
	වටිනාකම	රු. මි	2.20	1,753.46
කරාඹු	පරිමාව	මෙට්‍රික් ටොන්	0.00	1,856.71
	වටිනාකම	රු. මි	0.01	5,946.54
කරාඹු නැටි	පරිමාව	මෙට්‍රික් ටොන්		468.42
	වටිනාකම	රු. මි		617.26
කරාඹු තෙල්	පරිමාව	මෙට්‍රික් ටොන්	2.24	12.72
	වටිනාකම	රු. මි	22.67	144.25
කොකෝවා	පරිමාව	මෙට්‍රික් ටොන්	5,657.56	1,711.27
	වටිනාකම	රු. මි	7,542.35	4,212.43
කෝපි	පරිමාව	මෙට්‍රික් ටොන්	400.96	50.96
	වටිනාකම	රු. මි	1,018.23	172.11
ගම්මිරිස්	පරිමාව	මෙට්‍රික් ටොන්	51.55	11,415.65
	වටිනාකම	රු. මි	129.31	23,464.15
ගම්මිරිස් තෙල්	පරිමාව	මෙට්‍රික් ටොන්	0.52	92.44
	වටිනාකම	රු. මි	1.66	1,252.76
ඔලියරොසින්	පරිමාව	මෙට්‍රික් ටොන්	6.08	257.76
	වටිනාකම	රු. මි	55.98	3930.50
කරඳමුංගු	පරිමාව	මෙට්‍රික් ටොන්	0.13	2.64
	වටිනාකම	රු. මි	0.43	46.04
කරඳමුංගු තෙල්	පරිමාව	මෙට්‍රික් ටොන්	1.45	1.01
	වටිනාකම	රු. මි	73.37	104.99
පැහිරි	පරිමාව	මෙට්‍රික් ටොන්	0.37	2.15
	වටිනාකම	රු. මි	2.41	18.14
සේර	පරිමාව	මෙට්‍රික් ටොන්	0.00	
	වටිනාකම	රු. මි	0.02	
සාදික්කා	පරිමාව	මෙට්‍රික් ටොන්	0.00	1,978.89
	වටිනාකම	රු. මි	0.01	4,314.52
වසාවාසි	පරිමාව	මෙට්‍රික් ටොන්	0.00	305.03
	වටිනාකම	රු. මි	0.02	1,797.07
වසාවාසි තෙල්	පරිමාව	මෙට්‍රික් ටොන්	0.00	0.68
	වටිනාකම	රු. මි	0.00	2.04
සාදික්කා තෙල්	පරිමාව	මෙට්‍රික් ටොන්	2.16	62.76
	වටිනාකම	රු. මි	40.09	1,102.37
වැනිලා	පරිමාව	මෙට්‍රික් ටොන්	0.01	0.85
	වටිනාකම	රු. මි	0.04	49.02
වැනිලා තෙල්	පරිමාව	මෙට්‍රික් ටොන්	4.58	0.26
	වටිනාකම	රු. මි	17.75	0.73
පුවක්	පරිමාව	මෙට්‍රික් ටොන්	36.00	16,977.71
	වටිනාකම	රු. මි	54.72	21,187.34
බුලත්	පරිමාව	මෙට්‍රික් ටොන්		3,908.05
	වටිනාකම	රු. මි		5,034.53
ඉඟුරු	පරිමාව	මෙට්‍රික් ටොන්	0.12	128.49
	වටිනාකම	රු. මි	0.66	223.40
ඉඟුරු තෙල්	පරිමාව	මෙට්‍රික් ටොන්	4.03	2.03
	වටිනාකම	රු. මි	44.83	104.42
කහ	පරිමාව	මෙට්‍රික් ටොන්	0.02	43.42
	වටිනාකම	රු. මි	0.06	182.06
ගොරකා	පරිමාව	මෙට්‍රික් ටොන්	24.04	90.11
	වටිනාකම	රු. මි	8.19	234.19
එකතුව	**පරිමාව**	**මෙට්‍රික් ටොන්**	**6,215.91**	**58,192.95**
	වටිනාකම	**රු. මි**	**9,097.08**	**149,050.41**

ANNUAL PERFORMANCE REPORT 2022





අතමිටුසරු හොඳින්නකට...

+ 94 812 388651
helpdesk@dea.gov.lk
www.dea.gov.lk
1095, Getambe, Peradeniya, Sri Lanka.

Cover Designed@ COM DIV | DEA